# හෙලේනා

හෙවත්

සිරි කැළැල් සටහන් ලැබූ

ලාඩක්ක තාපසිකාවකගේ

චරිතාපදානය

---


කර්තෘ:-

අති උත්තම ධර්මාචාර්ය

එඩමන්ඩ පීරිස්, ඕ. ඇම. අයි.

රාජගුරු ප්‍රසාදීන්වහන්සේ.



1945.

# හෙලේනා

හෙවත්

## සිරි වණ කැළැල් සටහන් ලැබූ
## ලාංකීක තාපසිකාවගේ
## චරිතාපදානය

කර්තෘ :-

අති උත්තම දේවධර්මාචාර්

**එඩ්මන්ඩ් පීරිස්, ඕ. ඇම්. අයි**

රාජගුරු ප්‍රසාදීන් වහන්සේ

1945

# දැන්වීමයි.

මේ ග්‍රන්ථයෙහි අඩංගු කරුණු සියල්ල එහි සඳහන් කරන ලද ලිය කියමන් ආශ්‍රයෙන් මිස ශුද්ධවූ සභාවේ කිසි තීරණයක් අනුව නොවේයයි සැලකිය යුතුයි. එබැවින් මෙහි කියැවෙන 'පුදුම' , 'ප්‍රාතිහාර්යයන්', 'දර්ශන', 'කැළැල් සටහන්' යනාදී වචන පොදු ජනයා අතරේ බැවහර අර්ථය විනා ශුද්ධවූ සභාවේ විනිශ්චයකින් නියමවන අර්ථයක් නොදරයි. තම දරුවන්ගේ ශුද්ධවත් භාවය ගැන තීරණය කිරීම අප මාතෘවන ශුද්ධවූ සභාවටම අයිති කාර්යයකි. එම තීරණයට අපගේ මේ ග්‍රන්ථයත් එහි අන්තර්ගත කාරණාත් ශ්‍රද්ධා සිතින් යටත් කරමු.

කර්තෘ

---


**IMPRIMATUR.**

**Edmund Peiris, O. M. I.**

*Episcop. Chilaw.*

**28. X. 45.**

*Chilaw.*

## මෙම "හෙලේනා චරිතය" පොත කියවීම ආරම්භයට පෙර

මෙම පොතෙහි අඩංගු වන්නේ දේව සේවිකා ගෝනවිල ගරු හෙලේනාතුමියගේ චරිතාප්‍රදානය හා දෙවි මහෝත්තමයාණන් වහන්සේ විශේෂ දේව කර්තව්‍යයක් සඳහා එතුමිය තෝරා ගෙන ඒ සඳහා කරන ලද මැදහත්වීම ගැන වූ දේව ක්‍රියාවලියයි.

මෙවැනි තෝරාගැනීම් දෙවියන් වහන්සේ විසින්ම ඔවුන් වහන්සේගේම එකම අභිමතය පරිදි කරන ලද දෙයක්ම මිස මෙලොව කිසිවකුට, දීර්ඝ කාලීනව නොකඩවා යාච්ඤා කර හෝ දැඩිව කන්නලව් කර ඉල්ලා සිට හෝ ලබා ගත හැකි දේව දීමනාවක් නොවේ. අදාළ අයගේ දූහැමි බව සලකා ඔවුන් මුලින්ම අභිරහස්මය (Mystical) ජීවිතයකට යොමුකර - කුමන හෝ පාප කිළුටක් ඉතිරිව තිබුණේ නම් ඒවාද ස්වකීය ප්‍රේමයේ ගින්නෙන් දවා දැඩි ලෙස පිරිසිදු කර - තම දිව්‍ය පුත්‍රයාගේ දුක්ඛප්‍රාප්තියේ ශ්‍රී වණකැළැල් මිනිස් ඇසට පෙනෙන සේ සජීවීව ලබාදීම අති විශිෂ්ට දේව ප්‍රාතිහාර්යයකි. දෙවි ස්වාමීන් වහන්සේ අප සමග නිරතුරුව වැඩ සිටින බව නැවත නැවත ස්ථිර කිරීමටත් මේ මගින් ලෝකවාසීන්ට පණිවිඩයක් ලබා දීමටත් සිදු කරන අති උත්කෘෂ්ඨ වූ දිව්‍යමය ක්‍රියාවලියකි.

කිසිදා පාසලකට අකුරු ඉගෙනීමට ගොස් නැති - තම පියාගේ හා වැඩිමහල් සොහොයුරාගේ දැඩි කිතුණු ආගම් විරෝධීත්වය නිසාම සිදු වූ කායික හා මානසික පීඩන හමුවේ පසුබෑමකින් තොරව ගරු හෙලේනාතුමිය දේව සත්‍යයට සාක්ෂි දැරීම පුදුම සහගත වන අතර ගෝනවිල වැනි පිටිසර දූෂ්කර ගමක දැන් තිබෙන තාක්ෂණික පහසුකම් නොව ගමන් කිරීමට හරි හැටි අඩිපාරක් පවා නොතිබුණු සමයක මෙවැනි අති ආශ්චර්යමත් සංසිද්ධියක් ක්‍රියාත්මක වී ඇත්තේ දේව අභිලාෂය හා දේව මැදහත්කම නිසාම බව ඉතා පැහැදිලි ය.

මෙම ශ්‍රී වණකැළැල් ලැබීම ඉතා දුලබ දේව දීමනාවකි. මෙතෙක් ලොව පුරා එසේ ලැබී ඇත්තේ 461 දෙනෙකු වැනි ඉතා සුළු පිරිසකට වන අතර ලක්ෂ 14කට ආසන්න සිරිලක කිතුණු අප අතරින් මෙකී ගරු හෙලේනාතුමියට පමණකි.

සාන්තුවරභාවයට එසවීමේ සහා ක්‍රියා පිළිවෙත් හා නීති මාලාවන් අනුව කටයුතු කිරීමේ දී ප්‍රමාදයත් සිදුව ඇතත් 2016 මැයි මස 19 දින දී එතුමිය සම්බන්ධ නිල ක්‍රියාවලිය ආරම්භ කිරීමට ශුද්ධාසන නිල අවසරය ලැබී ඇති අතර ඊට අදාළ මූලික පදවි පරීක්ෂණය අති උත්තම දේවශ්‍රීත වැලන්ස් මෙන්ඩිස් හලාවත රදගුරු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් දැනටමත් ආරම්භ කර ඇත.

බාධක මැඩගෙන දේව සත්‍යයට ගරු කළ අන්දම මෙන්ම යක්ෂයා විසින් ඇයට ශාරීරික වද හිංසා පවා කරද්දී දේව පුත්‍රයාණන් වහන්සේම මැදහත් වී - යක්ෂයා ඇගේ පයින් පාගා නිරා පාතාලයට පළවා හැරීමට ගරු හෙලේනාතුමියට ලබා දුන් වරම ගැන මේ පොතෙන් ඔබට කියවිය හැක. දේව විශ්වාසය දේව භය භක්තිය මෙන්ම එතුමිය වෙත තිබුණු දේව ජ්වලිත භාවයෙන් මෙන්ම නිතිපතා අති ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වෙත තිබුණු බැතිය හා භක්ති ආදර ඇල්ම අප කාටත් මහත් මඟ පෙන්වීමකි.

දෙවිපියාණන් වහන්සේගේම තෝරාගැනීම වූ දේව සේවිකා ගරු හෙලේනාතුමිය සාන්තුවරියක ලෙස නම් කරලීමේ මෙම මහඟු සත්ක්‍රියාවට ශ්‍රී ලාංකික ඔබ සැමට දායක විය හැක. ඔබගේ දිනපතා යාච්ඤා හා මර්දන ක්‍රියා ආදිය නොවරදවාම මෙම අදහස වෙනුවෙන් ඔප්පු කරන මෙන් ඉල්ලමු.

"අප දෙවියන් වහන්සේගේ දරුවන් බවට ආත්මයාණෝම අප සිත හා එක්ව සාක්ෂි දරති. අපි දරුවෝ නම් උරුමක්කාරයෝ ද ක්‍රිස්තුස්වහන්සේ හා සමග හවුල් උරුමක්කාරයෝ ද වම්හ. මන්ද දැන් උන්වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයන් වීමෙන් අනාගතයේ දී උන්වහන්සේගේ මහිමයේ පංගුකාරයින් ද වම්හ. (රෝම 8-16:17)

ගෝනවිල මීසම්පති ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමාගේ මඟපෙන්වීම යටතේ අති උත්තම දේව ධර්මාචාර්ය දේවශ්‍රීත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ අනුදැනුම ඇතිව 2019. 02. 08 දින දී මුද්‍රණය කරවන ලදී.

ගරු හෙලේනා පදනම ගෝනාවිල මෙම සාන්තුවර ක්‍රියාවලියේ සභාව පිළිගත් නිල පෙත්සම්කරු



ගෞ.ගාර්සියා පියතුමා



හෙලේනා කන්‍යාව

# හෙලේනා චරිතය.

## ප්‍රාරම්භය

වර්ෂ 1931 පෙබරවාරි මස 08 වන දින රාත්‍රියේ දකුණු පිටිගල් කෝරළේ ඕතර පළාතේ ගෝනාවිල නමැති ග්‍රාමයේ එක්තරා කතෝලික ගෘහයක කන්‍යා සහෝදරියක් කාලක්‍රියා කළාය. එම ගම කතෝලිකයන් අතර එතුමිය හඳුන්වන ලද්දේ "සිස්ටර් හෙලේනා, හෙලේනා ගුරුන්නාන්සේ, හෙයියා ගුරුන්නාන්සේ"යනාදි නාමයන්ගෙනි. දෙදිනකට පසු ඇගේ මෘත දේහය ගෝනවිල කතෝලික මිනීපිට්ටනියේ මහත් ගෞරවයෙන් මිහිදන් කරන ලදී. අවමංගල්‍යය සඳහා බස්නාහිර, වයඹ යනාදී පළාත්වලින් සුවිශාල ජන පිරිසක් ද, පූජාප්‍රසාදීන් වහන්සේලා කිහිප දෙනෙක් ද පැමිණ සිටියහ. එවැනි සම්භාවනීය අවමංගල්‍යෝත්සවයක් ඒ පළාතේ බොහෝ කාලයකින් දක්නට නොලැබිණි. පරලෝ සැපත් උත්තමිය ධනය, නිලය යනාදි ලෞකික උන්නතියක් නිසා ප්‍රකට නොවූවාය. එහෙත් ඇගේ මෘත දේහයට දක් වූ සම්මානය විස්මය ජනකය. එදින ගෝනවිල කරා පැමිණි සන්නිපාත මහ ජනයා අතරෙන් ඇතැමෙක් එම සිරුර පිළිබඳ ඈත කාලයේ දී සිදු වූ එක්තරා පුදුම පුවතක් සිහි කළහ. ඇතැමෙක් ඇගේ ධර්මධර ආදර්ශවත් චරිතය වර්ණනා කළහ. ඇතැමෙක් ඇගේ යාච්ඤා නිසා ලබාගත් ආත්මික, ශාරීරික වරප්‍රසාද විස්තර කළහ. එදින සියල්ලන් තුළ පැතිර පැවතුණ එකම හැඟීම නම්, එතුමී දෙවියන් වහන්සේගේ විශේෂ කරුණා බැල්මට පාත්‍ර වූ ශුද්ධවූ උත්තමියක් බවය.

එතුමීගේ උත්තම චරිතය ලක්වැසි කතෝලකයන්ට මවු බසින්ම හඳුන්වා දීමට අපි ඉදිරිපත් වෙමු. මෙහි සඳහන්වන කරුණු උපුටා ගන්නා ලද්දේ ගැමියන් වටා ගොතාගත් කතාන්දරවලින් නොව සමකාලීන ගරු කටයුතු වැදගත් ලිපිවලින්මය. මේවා අතරෙන් ප්‍රධාන ඒවා මෙහි සැකෙවින් පෙන්වා දෙන්නෙමු.

01. හෙලේනාගේ ආත්මික පියාණන් වූ ගෞ. ප්ලොරෙන්තිනෝ ගාර්සියා පියතුමන්ගේ **දිනපොත**. 1869 සිට 1897 දක්වා කාල පරිච්ඡේදයකට ඇතුළු වූ ඇතැම් ප්‍රවෘත්ති මෙහි සඳහන් කර තිබේ.

02. එතුමන්ගේ ලියුම් සහ දිවුරුම් පිට ලියා සහතික කරන ලද වාර්තා

03. එකල යාපනේ රදගුරු පදවියේ විකාර් අපොස්තලික තැන්පත් අතිඋත්තම දේවධර්මාචාර්ය ක්‍රිස්තෝපර් බොන්ජන් ඕ.ඇම්.අයි. ස්වාමිපාදයාණන් වහන්සේ විසින් හෙලේනා ගැන පවත්වන ලද පරීක්ෂණයේ ලුහුඬු සටහන්.

මේවා සියල්ලම පාහේ අත් අකුරෙන් ඉංග්‍රීසි, ලතින්, ප්‍රංශ, ස්පාඤ්ඤ සහ ඉතාලි භාෂාවන්ගෙන් ලිඛිතයි.

# උත්පත්තිය හා බාල කාලය

අප කථානායක උත්තමිය ගෝනවිල නම් ග්‍රාමයේ වර්ෂ 1848 අවසාන භාගයේ දී උපන්නී ය. එතුමියගේ ක්‍රිස්තියානිය පිළිබඳ බෝලවත්ත මීසමේ තෝම්බු පොතෙහි මෙලෙස ලියැවී තිබේ.

වර්ෂ 1849 මාර්තු මස 18 වන දින. නම:- හෙලේනා. වයස:- මාස 5 යි. පියා:- දෝන් අන්තෝනි. මව :- හෙලේනා හාමි. ගම:- ගෝනවිල. ආත්මික පියා:- සීමන් තිසේරාගේ පුත් පිලිප්පු තිසේරා. ආත්මික මව:- අන්දරේ පෙරේරාගේ දූ සෙලෙස්තිනා පෙරේරා. ප්‍රසාද ස්නාපනය දුන් පූජාප්‍රසාදීතුමන්ගේ නම:- ජේ. සේසාරේ මෝලා. පියාගේ නම:- විතාන අප්පුහාමිලාගේ දොන් අන්තෝනි පෙරේරා කියා ද සඳහන් වී ඇත. (ලුහුඬු සටහන්) මවගේ නාමය අල්ගමු කෝරාලලාගේ මදලේනා හාමි කියා ද සැලයි.

මේ යුවළට පුතුන් අසර දෙනෙක් ද, දූවරු තිදෙනෙක් ද උපන්නාහ. ඔවුන් අතරෙන් දූවරුන්ගෙන් බාල වූයේ හෙලේනා ය. කරෝලිස් නමැති වැඩිමලා පසු කලක දී ගම්මුලාදෑනිකමක් ලැබ කරෝ විදානේ යන නමින් ගමේ ප්‍රකට වූයේ ය. පියා බෞද්ධයෙක්ව සිට විවාහයට පෙර කතෝලිකාගම වැලඳගත් නමුත් පරණ විනයේ පෙළපාලිය හා සිරිත් විරිත් අනුසාර කළේ ය. බලි බිලි යන්ත්‍ර මන්ත්‍ර පිළිබඳ ගුරුකම් කළ බැවින් අදෝනිස් හෙවත් අදෝ කපුරාල යන නාමය ඔහුට දෙන ලදී. මවගේ උත්සාහය නිසා දරුවන්ට බාලවියේ දී ම ප්‍රසාද ස්නාපනය ලැබුණේ ය. දෙවූ පුත් වන කරෝලිස් තම පියාගේ පියහසරේ සැරිසරමින් කතෝලිකාගමට විපක්ෂ වූයේ ය. එහෙත් දූවරු

තිදෙන භක්තිමත්, ආදර්ශවත්, ශ්‍රද්ධාකාමී කතෝලිකයෝ වූහ. මේ හේතුවෙන් හටගත් මතභේදය නිසා ගෙදර විටින් විට කරදර හා කලකෝලහාල සිදු විය.

හෙලේනා බාල වියේ දී අකුරු හෝ ආගම ඉගෙනගනු වස් පාසලකට නොගියා ය. ගෙදර දී ද අප ශුද්ධවූ ආගම ගැන ඈට යම්කිසි උපදේශයක් නොලැබිණි. එබැවින් සියනෑ කෝරළේ මාකෝලේ නැමති ග්‍රාමයේ ස්වකීය බෞද්ධ ඥාතීන් සමග වාසය කළ කාලයේ දී නොතේරුම්කමින් පන්සල් හා දේවාලවලට ගියාය. එහෙත් තම සොයුරියන් දෙදෙනා අභිවෘද්ධි ආලේපය හා පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට සූදානම් වන බව අසා මවගේ අවසරය ඇතුව ගමට පැමිණ ඔවුන් සමග ඥානෝපදේශය ඉගෙන ගැනීමට බෝලවත්ත දේවස්ථානයට මාස දෙකක්ම දිනෙන් දින ගියාය. එවිට ඇගේ වයස අවුරුදු 12කි. මීසම පාලනාධිපති වූයේ ගෞ. ජ්ලොරෙන්තිනෝ ගාර්සියා පියතුමාය. වර්ෂ 1860 දෙසැම්බර් මාසයේ දී අති උත්තම සෙමේරියා ඕ. ඇම්. අයි. රාජගුරුතුමාණෝ බෝලවත්තට පැමිණ මාස තුනක්ම එහි ගත කළාහ.

හෙලේනා ආගම ඉගෙන ගැනීමට පෙන් වූ උනන්දුවත්, ජේසුස් ස්වාමිදරුවන් ලබා ගැනීමට දක් වූ ආශාවත් නිසා තම සොහොයුරියන් සමග අභිවෘද්ධි ආලේපයත්, දිව්‍ය සත්ප්‍රසාදයත් ලබා ගැනීමට තෝරා ගන්නා ලදී. එතුමී පළමුවරට පාපොච්චාරණය සඳහා පැමුණුනේ ගෞ. චූනවෙල් ඕ. ඇම්. අයි. පියතුමා වෙතටය. මෙතැන් සිට එතුමීගේ ජීවිත කතාවේ රන් පිටුව පෙරළෙන නිසා එය වඩා හොඳට අවබෝධ කරගනු වස් දතයුතු ඇතැම් අතුරු කාරණා මෙහි සැකෙවින් සඳහන් කිරීම හොබනේ ය.

## ජන්ම භූමිය

කම්මල් ගම්මානය ලංකා කතෝලික ඉතිහාසයේ එක්තරා ප්‍රසිද්ධියක් දරයි. වර්ෂ 1604 දී පමණ බල්තසාර් ගාර්සියා නමැති ජේසු කුට්ටමේ පූජාප්‍රසාදි නමක් එහි පළමුවරට ක්‍රිස්තු ශාසනය දේශනා කළේ ය. හය අවුරුද්දක් ගතවනු පෙර එහි කතෝලික භක්තිකයන්ගේ සංඛ්‍යාව 700කට වැඩිවූයෙන් අලුත් දෙව් විමනක් ඉදිකරන ලදී. එය

ආශිර්වාද කරන ලද දින දී මහෝත්සවයක් පවත්වා ගම් වැසියෝ ලෝකය මැවීමේ සහ මාංශගතවීමේ ප්‍රවෘත්ති නාට්‍යාකාරයෙන් පෙන්වූහ.

අභිනව ශ්‍රද්ධාවතුන්ගේ යහපත් ගතිගුණ ගැනත්, විශේෂකොට ආගම සම්බන්ධ ළමුන්ගේ පැහැදීම ගැනත් එකල ධර්ම දේශනා පැවැත් වූ පූජාප්‍රසාදීන් වහන්සේලා ප්‍රශංසා මුඛයෙන් වර්ණනා කළෝ ය. සෑම ඉරිදාම දේවස්ථානයේ දී පාසැල් ළමෝ ඥානෝපදේශය කථෝපකතනය වශයෙන් හෙවත් ප්‍රශ්නෝත්තරාකාරයෙන් උච්චාරණය කළෝ ය. සැදැහැවත්හු ශුද්ධවූ කුරුසිය කෙරෙහි විශේෂ භක්තියක් පෙන්වූහ. වරක් ඔවුහු විශාල ලී කුරුසියක් ගම් ප්‍රධානීන්ගේ මෙහෙයවීමෙන් පෙරහරින්, ගී, නැටුම්, තූර්යනාද සහිතව ගෙනගොස් නටබුන්ව තිබූ දේවාලයක බිම් කොටසේ පිහිටෙව්වා හ. ඔවුහු නියගය හා ලෙඩදුක් පැමිණි කල එතනට අවුත් අප ගැලවීමේ ලකුණ සිහිකරගෙන යාච්ඤා කිරීමට පුරුදු වී සිටියෝ ය.

1617 දී නිකපිටියේ බණ්ඩාර කැරැල්ලක් ඇති කළ බැවින් කලකෝලහාල හටගෙන රටේ සමාදානයත්, සාමයත් නැතිවිය. ශුද්ධවූ සභාවට ද නොයෙක් හිරිහැර පැමිණුණේ ය. කම්මල දේවස්ථානය කැරලිකරුවන් විසින් බිඳ හෙළන ලදී. කතෝලිකයෝ ද පණ රැකගැනීමට ගම් හැර වනගත වූහ. එහෙත් ඒ අර්බුදය නැතිවූ කල නැවතත් ඔවුහු ගමට පැමිණ දේව මන්දිරය සාදා ගත්තෝ ය. 1628 සිට පූජාප්‍රසාදි නමක් කම්මල පදිංචිව අවට ගම් නියම්ගම් සත්‍යාලෝකයෙන් බැබලුවේ ය.

සමකාලීන වාර්තාවලින් පෙනෙන සැටියට 1644 දී කම්මල කතෝලික පිරිස 1000 ක් ද පාසල් ගිය ළමුන්ගේ ගණන 150ක් ද විය. ඕලන්ද බලය ලංකාවේ තහවුරු වීමෙන් 1656 සිට 1687 දක්වා එක පූජාප්‍රසාදි නමක්වත් මෙරට නොසිටියේ ය. ගෞරවාදරයට පාත්‍රවූ ශුද්ධවූ ජුසේවාස් පියතුමන්ගේ ආගමනයෙන් පසු නැවතත් කම්මල වාසීන්ට ශුද්ධවූ සභාවේ දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමේ සහ ධර්ම දේශනා ඇසීමේත් භාග්‍යය අත්වුණේ ය. ඕලන්ද සමයේ දී හලාවත-පුත්තලම දෙදිසාව සිංහල පාලනයට වසඟ වූයෙන් වේදභේදකාරයන්ගේ තාඩන පීඩන පහව ගියේ ය. එබැවින් ගෞ. වාස්තුමා සහ අනිකුත් ඔරතෝරියානු පියවරු ද කම්මල පළාත

මූලස්ථානයක් කරගෙන විටින් විට මීගමුව - කොළඹ කරා දේව මෙහෙය පැවැත්වීමට එළඹුණාහ.

ගෞ. ගොන්සාල්වෙස් පියතුමන්ගේ පොත්පත් කිහිපයක්ම ලියැවුණේ කම්මල දී ය. වර්ෂ 1741 දී එතුමාණෝ බෝලවත්ත ප්‍රධාන ස්ථානය කරගෙන, උන්වහන්සේගේ අවසාන කාලය එහිම ගත කළාහ. එබැවින් එම ගම උන්වහන්සේගේ මෘත දේහය දරා සිටින්නට වාසනාව ලද්දී ය. 1746 දී ශ්‍රී විජය රාජසිංහ රජතුමා මහනුවර එක්තරා දුර්මුඛ පිරිසක් විසින් පීවත් කරන ලද ආගම් අවතාරයකට භයවී කන්ද උඩරට රාජධානියට අයත් අහංසක රාජපාක්ෂික කතෝලිකයන්ගේ දේවස්ථාන කිහිපයක්ම දවන බිල්ලක් වශයෙන් පූජා කළේ ය. බෝලවත්තේ පූජනීය දෙව් විමන එකල විනාශ මුඛයට පත් වූ නමුත් 1769 දී නැවතත් ඉදිකරන ලදී. තවද ඕලන්දයන් කතෝලිකයන්ට ආගමික නිදහස දුන් නිසා ශු. සභාව නව ජීවනයක් ලැබ ශ්‍රී ශෝභාවයෙන් විරාජමාන වූවා ය. ඉංගිරිසි ආණ්ඩුව යටතේ 1806 දී සම්පූර්ණ ආගමික නිදහස දෙන ලදී. 1835 දී ලංකා කතෝලික සභාව අභිනව රාජගුරු පදවියක් විය. එහෙත් ක්‍රිස්තු ශාසනය මරුමුවෙන් බේරාගත් ඔරතෝරියානු පංතිය, ප්‍රතිකාල් ආණ්ඩුවේ අකටයුතුකම් නිසා තහනම් වූයෙන් යුරෝපීය ධර්මදූතවරු නැවතත් ලංකාවට පැමිණියෝ ය. 1847 ලංකාවේ කතෝලික සභා පාලනය පළාත් දෙකකට බෙදන ලදී. මහ ඔයෙන් උතුරට යාපනේ පදවිය ද, දකුණට කොළඹ පදවිය ද නම් විය.

1850 අගෝස්තු මාසයේ දී බෝලවත්තේ අභිනව (එනම් දැන් තිබෙන) දේවස්ථානය අති උත්තම බෙතකීනු රාජගුරුතුමන් විසින් ආශිර්වාද කරන ලදී. (මේ දෙව්මැඳුර 2001 දී ඉවත් කරන ලදී) එකල කම්මල හා බෝලවත්ත කතෝලිකයන්ගෙන් ගහනව පැවතුණ නමුත් ඉන් උඩහට ගම් නියම්ගම්වල බෞද්ධයෝ බහුල වූහ. ගොඩැල්ල - ගෝනාවිල පළාතේ පන්සල් හා දේවාල ද තිබුණේ ය. වර්ෂ 1844 දී ගොඩැල්ලේ දේවස්ථානයක් ගැන ඔරතෝරියානු වාර්තාවක සඳහන් වී ඇත. ගෝනාවිල දෙව්මැදුරක් ඉදිකිරීමට ඉඩම් කැබැල්ලක් මිලයට ගන්නා ලද්දේ වර්ෂ 1867 දී ය.

# දහම් පිය ගැට

හෙලේනාගේ ධර්ම ජීවිත යාත්‍රාව පටන් ගැන්මේ සිටම සංකා හා දුර්පරීක්ෂා නැමති චණ්ඩ තරංගයෙන් ගලවාගෙන, අගති විමති නැමති ගල්පරයන්ගෙන් බේරාගෙන, කරදර කම්කටොලු නැමති සැඬ සයුරේ පරතෙර දක්වා විධි විධානය කරමින් අන්තිමේ දී ශාන්තිකර දර්ශනය එතුමීට පෙන්වූයේ ගරු ප්ලොරෙන්තිනෝ ගාර්සියා පියතුමා ය. එතුමා ස්පාඤ්ඤ දේශයේ ඉපිද ශු. බෙර්නාර්දු මුනිතුමන් විසින් ස්ථාපිත සිස්ටර්සියානු ධර්ම පන්තියේ පැවැදි වූ උගත් භක්තිමත් තාපසයෙකි. අදේව දෘෂ්ටික ආණ්ඩු ක්‍රමයක් විසින් පැවිදි වරුන්ට විරුද්ධව පනවන ලද ආණ්ඩු අණ පනත් නිසා සියරට හැර ඉතාලියේ විප්‍රවාසීව සිට, වර්ෂ 1845 අගෝස්තු මස 14 වන දින දී තවත් ස්පාඤ්ඤ ජාතික තාපසයකු වූ ගෞ. ප්ලොරියානු ඔරුඤ්ඤ පිතුමන් සමග ලංකාව තරණය කළේ ය. එතුමා ත්‍රිකුණාමලයේ ටික කලක් ධර්මදූත මෙහෙය පැවැත්වුවායින් පසු, වර්ෂ 1849 දී හලාවත මීසම් පාලනයට පත් කරන ලද්දේ ය. එකල මේ මීසම මහඔයේ සිට දුදුරු ඔය දක්වා විශාල වූයෙන් 1850 දී මීසම් දෙකකට බෙදන ලදුව, බෝලවත්ත ගාර්සියා පියතුමන්ට ද හලාවත ඔරුඤ්ඤ පියතුමන්ට ද භාර විය. එවක් පටන් තම මරණය, එනම් 1900 දක්වා බෝලවත්ත එතුමන්ගේ මූලස්ථානය වූයේ ය.

හෙලේනා තුමී පළමුවරට පාපොච්චාරණය කරන විට ඒ ගැන හරි තේරුමක් නොතිබුණත්, කල් යත් යත් කරුණු සියල්ල වඩා හොඳට පහදාගෙන නැවත නැවතත් ඒ දේවප්‍රසාද නිධානය ලබා ගත්තා ය. දිව්‍ය සත්ප්‍රසාද මාර්ගයෙන් ජේසු ස්වාමිදරුවන් ස්වකීය හෘදය තුළට වඩවා ගත්තායින් පසු ලෙව් සැපත කෙරෙහි පිළිකුල් ගතියක් ද තම ආත්මය ගලවා ගැනීමට ජ්වලිත ආශාවක් ද, දෙවියන් වහන්සේට ඒකාන්තයෙන් ම කැපවීමට දැඩිතර අවංක කැමැත්තක් ද එතුමීට හැඟුණේ ය. එබැවින් පව් මුල් අගුණවල් සහමුලින්ම උදුරා නැතිකර දමන්නට උත්සාහ දැරුවා ය. දිව්‍ය සත්ප්‍රසාදය ලබාගත් දිනවල සිය හද තුළ ගින්නක් මෙන් දැල්වුණි. ඒ හැඟීම දිව්‍ය භෝජනය අනුභව කළ සෑම වාරයේ දී ම අලුත් වුවත් අනෙක් වාරය දක්වා දිනෙන් දින අඩුවිය.

එකල තම ගම විසූ අනිකුත් ළඳුන් මෙන්ම හෙලේනා ද ඇඳුම් පැළඳුම් ගැනත්, ක්‍රීඩා ගැනත් උනන්දු වූවා ය. එහෙත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත් දිනවල ඒවා ගැන නොසලකා ස්වකීය

ස්වාමිදරුවන් ගැන පමණක් සිත යොමු කළා ය. එතුමීට ධර්මෝපදේශය ඉගැන්වූවෝ ගෞ. ගාර්සියා, ගෞ ප්‍රැන්සිස්කු සේවියෙර් සහ තවත් පියවරුන් ය. තුන් මසකට වරක් පාපොච්චාරණය කිරීමටත් දිව්‍ය භෝජනය අනුභව කිරීමටත් එතුමීට අවසර ලැබිණි. වැරැද්දක් කළ විට ඒ ගැන වහාම දුක් වී හිස නමා පොළොවේ කුරුසේ ලකුණ දැක්වීම එතුමීගේ සිරිතක් විය. භාවනා කිරීමේ විධි ක්‍රම සහ ශරීර මර්ධනය පිළිබඳව මේ සමයේ දී ඇට තේරුම් පැහැදුම් නොතිබුණ නමුත් සෑම සෙනසුරාදා දිනවල ද චතාරිකයේ සිකුරාදා දිනවල ද එක්වරුශීලය රක්‍ෂා කළා ය. අවුරුදු තුනක් ම ඈ ගත කළ ජීවිතය සුළු සුළු වැරදිවලින් ගහනය වූ ද, ජ්වලිත භක්තියෙන් හා ඇල් මැරුණු ගතියෙන් සම්මිශ්‍ර වූ ද කාල පරිච්ඡේදයක් විය. (ලුහුඬු සටහන්)

## ධර්ම සංග්‍රාමය

හෙලේනාගේ ධර්ම වීර්යය ස්ථිර වීමටත් ගුණ ලක්‍ෂණ ප්‍රගුණ වීමටත් හේතු වූයේ තම පියාගෙන් ද වැඩිමහල් සහෝදරයාගෙන් ද ඇති වූ වාද විරෝධවල් ය. ඔවුහු නමින් කතෝලිකයෝ වුවත් බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර අනුවම කල් යැවූහ. ක්‍රියාවෙන් පමණක් නොව වචනයෙන් ද දෙවියන් වහන්සේට අපහාස කළහ. යන්ත්‍ර, මන්ත්‍ර, නැකත්, හූනියම් ආදී විමති විකාරයන් ඔවුහු පිළිපැද්දාහ. තුන් අවුරුද්දක් මුළුල්ලේ ම ඔවුහු තම දූවණියන් පල්ලිවලින් වළක්වා පන්සල් දේවාලවලට ගෙනයාමට හැකි පමණ තැත් කළෝ ය. ඇතැම්විට ඇගේ රෙදි පිළි ආදිය සඟවා දමා පූජාවට යාම නවත්වන්නට උත්සාහ කළෝ ය. එහෙත් එතුමී කදිම උපායන් තනාගෙන දිනපතා දිව්‍ය පූජාවට ගියාය. ඇගේ භක්තිය ඔවුන්ගේ සරදමට ලක්වූවත් නිර්භයව ස්වකීය ශ්‍රද්ධාව ප්‍රකාශ කළාය.

ඇගේ දෙටු සොහොයුරා මල් පිදීමට මල් පැලක් සාදා මිදුලේ පිහිටවී සැමවිටම, ඈ එය කඩා හෙලා දැමුවා ය. වරක් ඔහු මතුරා තැබූ පැන් තළියක් ඈ අතට ගෙන යක්ෂයාගේ බලයට නිගාකරනු වස් පැන් පානය කළා ය. මේවා දුටු සොහොයුරා කෝපාග්නියෙන් දිළිහී තම සිත් පිත් සැනසෙන තුරු දූව දණ්ඩකින් ඇයට අච්චු කළේ ය. ඔහුට ලැබුණු කුලුදුල් බොලදාව ප්‍රසාද ස්නාපනය සඳහා දේවස්ථානයට ගෙන යන්නට පෙර, ජාත කර්මාදිය ඉටු කිරීමට දේවාලයක් බලා

එළඹුණේ ය. හෙලේනා මැදට පැන "මා මරතත් දේව දරුවකු යකුන්ට පිදීමට ඉඩ නොදෙමි" යි කියා වැලපෙමින් එය වැලැක්වූවා ය. මේ ගැන කිපුණ සහෝදරයා පොල්ලක් ගෙන "නුඹවත් මරලා මමත් එල්ලුම් ගහට යනවා." යි මොර ගසමින් ඇගේ හිසත් කයත් ඉදිමෙනතුරු ඇට තැළුවේ ය. එහෙත් හෙලේනා ඔහු වෙත කිසිදු තරහවක් නොපෙන්වා ඔහු කළ වද වේදනා සියල්ල ම ඔහුගේ සිත හැරීම සඳහා දෙවියන් වහන්සේට ඔප්පු කළා ය.

දිනක් ඇගේ පියා දේවතා පූජාව පිණිස දේවාලය කරා ගෙන යාමට තෙල්, මල්, ලෙලි හරින ලද පොල් ආදිය පිළියෙල කර තැබුවේ ය. මේ දුටු හෙලේනාට ඉහිලුම් නැති විය. ප්‍රසාද ස්නාපනයේ ජලයෙන් හා ශුද්ධවූ තෛලයෙනුත් සැබැවූ එකම දෙවි මහෝත්තමයාණන් වහන්සේට කැපකරන ලද යමකු අපාගත සතුරා වන යක්ෂයාට මෙලෙස පුද පඬුරු පිදීමෙන් වසඟවීම අධික ශෝකයට කාරණාවක් විය. එබැවින් එය යම් ක්‍රමයකින් හෝ වළක්වන්නට ඕ අදහස් කළා ය. දේවතා පූජාවට ගෙනයන කිසිවක් ඉඳුල් නොකර ගෙන යාම චාරිත්‍රයක් බව දැන සිටියා වූ එතුමී " යක්ෂයා ද ජේසු ස්වාමිදරුවෝ ද බලවතා කියා බලමු." යි කියමින් අර තෙල්වලින් ටිකක් හිසේ ගා ගත්තා ය. පොල් ගෙඩියක් සිදුරු කර එහි ජලය පානය කළා ය. අනිකුත් ඒවා ද අත පත ගා ඉඳුල් කර දැමුවා ය. මීට පියාගෙන් ලැබුණ පිළිතුර නම් ගුටිබැට සංග්‍රහයකි.

## ජයග්‍රහණය

පෙර කී අවුරුදු තුන කම්කටුලු, උවදුරු, අපහාස යනාදියෙන් පරිපූර්ණ කාලයක් වුව ද, එය හෙලේනාගේ ශ්‍රද්ධා ශක්තියත්, ධර්ම කීර්තියත් බැබළ වූ කාලය ද වේ. සංග්‍රාමයෙන් එතුමී නික්මුණේ ආධුනිකයකු හැටියට නොව දහම් අවි සරඹයෙහි නිපුණ වීරවරියක සැටියට ය. රන් කරුවා රන් කැටයක් ගෙන ගින්නේ ලා එය සෑම මලයෙන් නිදොස් කරන්නේ යම් සේ ද එසේම දෙවියන් වහන්සේ උවදුරු මගින් ධර්මිෂ්ඨයන් සකල පාප දෝෂවලින් නිදොස් කරන සේක. (දේශනා 11:5) තවුසන් මැද තපස් රැකීමට වඩා පවිටුවන් මැද කරදරවලට මුහුණ පාමින් නිමල ජීවිතයක් ගත කිරීම අපහසු කාර්යයකි. එය වීර චරිතයක අංගයක් මැයි. බාලවියෙන් තරුණවියට පිවිසෙන කාලය සැමට ම කොපමණ අන්තරාදායක කාලයක් ද? කාම

ආශා, අපිරිසිදු පරීක්ෂා, අමුතු අයුතු කැලඹීම් රැළ පතර මෙන් පැන නගියි. එයින් පීඩා විඳීම, වැටීගිය ආදම්ගේ ප්‍රජාවට නියම වන්නේ ය. එහෙත් එයින් නොතැළී, නොමැඩී මිදෙන්නෝ විශේෂ දේව ප්‍රසාදයට භාජනය වන්නෝ වෙති. පූර්වොක්ත වර්ෂත්‍රය හෙලේනා ගත කළේ තදබල අපිරිසිදු පරීක්ෂාවක් නොමැතිවය. (ලුහුඬු සටහන්)

# දෙවියන්ගේ දාසි

බාලවියේ දී ඈ පාසලට නොගිය බැවින් පොත පතකින් බලා ධර්ම මාර්ගය ගැන ඉගෙන ගන්නට අපොහොසත් වූවා ය. භාවනාව සහ දේවාභිමුඛයෙහි සංචාරය ගැනත් ඈට කරුණු කියා දුන්නේ යාපනේ මඩමේ ටික කලක් පුහුණුවුණ "රෝසා" නැමති භක්තිමත් ස්ත්‍රීයකි. හෙලේනාගේ සහෝදරියෝ ද එම ගුරුවරියගෙන් අගනා උපදේශ ලබා ගත්හ. මේ කුඩා පිරිස විටින් විට රැස්වෙමින් භාවනා කළාහ. යාච්ඤාරාධනා පැවැත්වූහ. යහපත් පොත් පත් කියැවූහ. කල් යත් යත් තවත් පින්වත් කාන්තාවෝ ස්වල්ප දෙනෙක් ඔවුන් ආශ්‍රය කරන්නට පටන් ගත්හ. ඔවුන් අතරෙන් ප්‍රධාන වූයේ ක්‍රිස්තිනා නැමැති ප්‍රඥාවත් තැනැත්තියකි. ඔවුන්ගේ පුණ්‍යකර්ම හා දේව භක්තිය දැනගත් ගාර්සියා පියතුමා ඔවුන් ප්‍රව්‍රජ්‍යාවේ හසුරවනු වස් 1866 දී පමණ පැවදි පංතියක් පිළියෙල කර දුන්නේ ය. එවක් පටන් ඔවුහු ගිහි ඇඳුම් ඉවත ලා පැවිදිවරියන් මෙන් කළු ඇඳුමෙන් සැරසී එම පාට උතුරු සළුවකින් හිස වසා ගත්තාහ. මුල සිටම හෙලේනා ඔවුන් ආශ්‍රය කළ නමුත් ඔවුන්ගේ සමාගමට වහාම නොබැඳුනා ය. ගෞ. ගාර්සියා පියතුමා ද දක්ෂ ගුරුවරයකු මෙන්, පැවිදිවීමට ඈට බල නොකර දෙවියන් වහන්සේ විසින් නියමිත වේලාව පැමිණෙන තුරු පුල පුලා බලා සිටියේ ය. එතුමා ඈයට භාවනාවේ විධික්‍රම කියා දෙමින් මරණය ගැනත්, ලෞකික සැපතේ අනිත්‍යය ගැනත් භාවනා කරන්නට නියම කළේ ය. භක්තිමත් ක්‍රිස්තිනා ද ඈට ආධාර කරන්නී, දෙගුරුන්ගෙන් හා ඥාති මිත්‍රාදීන්ගෙන් වියෝවීමේ විධිය ඈට පහදා දුන්නා ය. මෙවක් පටන් හෙලේනා ක්‍රම ක්‍රමයෙන් ධර්ම මාර්ගයෙහි පුහුණු වූවා ය.

එක් දිනක් එතුමී මෝක්ෂය ගැනත් නිරය ගැනත් භාවනා කරන කල හද තුළ මෙවැනි හඬක් ඇසුණේ ය. "නුඹ මා අතරෙත් මවුපියන් අතරෙත් වඩා හොඳ පක්ෂය තෝරා ගනින්. තෝරා ගත යුතු දෙය

කුමක්ද කියා විමසා බලාපන්" යනුයි. එතුමීගේ සිතෙහි මෙතැන් පටන් මාර යුද්ධයක් හටගත්තේ ය. ලෙව් සැපත කෙරෙහි ඇලුම්ව සිටි නමුත් සිය සොහොයුරා විවාහ වූවායින් පසු ඔහුට ඇති වූ කරදර දූන විවාහ ජීවිතය පිළිකුල් කළාය. එහෙත් මව්පියන්ගේ අදහස් මීට හාත්පසින්ම විරුද්ධ විය. ඔවුන්ගේ අනුබලය ලත් මගුල් කපුවෝ ද ඈ ලක් කරගෙන ගමේ කඩවසම් යොවුනන්ට පෙම් මදු ඇටවූහ. එහෙත් එතුමීගේ චරිත ශුද්ධිය දත් තරුණයෝ එතුමී බිරිඳ කරගැනීමට කැමැත්තක් බසින්වත් අකුරෙන්වත් එතුමීට ඉඟි නොකළාහ. දෙටු සොහොයුරු මේවා ගැන උග්‍ර ලෙස කෝප වෙමින් ඈට කියනුයේ "නුඹ අප කියන හැටියට කසාද බැන්දේ නැතිනම් නුඹට වෙඩි තබා මරනවා " යි කීය. ඇගේ එකම පිළිතුර වූයේ "හොඳයි, ඒත් මට කමක් නැහැ. මගේ අදහස නම් වෙනස් කරන්නේ නැහැ" යනුයි.

ධර්ම සම්පූර්ණකම කරා ගමන් කරන්නා විසින් කළ යුතු ප්‍රථම කෘත්‍යය නම් චරිත ශෝධනය ඇතිකර ගැනීම ය. හෙවත් පාපයෙනුත්, පාප ආශාවලිනුත් විනිර්මුක්ත වීමය. මීට ආධාර වන්නේ දිනෙන් දින තම ආත්මීක තත්ත්වය ගැන පරීක්ෂාකර බැලීමයි. එබැවින් හෙලේනා දිනපතාම උදේ සවස දෙකේම තම ගති ගුණ ගැන අවංක සිතින් විමසා ලැබුවා ය. සියලු අගති විමති සිතිවිලි සිතින් පහ කරන්ට තැත් කරන අතරම දේව ප්‍රේමයෙහි වර්ධනය වීමට ද, අධික උත්සාහයක් දැරුවාය. ඇගේ දැඩි දුර්ගුණය වූයේ ඉක්මනට කිපීම බැවින් එය මැඩලීමට වරම් ඉල්ලා දෙවියන් වහන්සේට යාච්ඤා කළා ය. මෙලෙස එතුමී ලෝකාශා ඉවතලා කාම තෘෂ්ණා මර්ධනය කර, පව් බැමින් මිදී, පව් මලින් පිරිසිදුව ජේසු ස්වාමී දරුවන් වෙත ප්‍රේමාග්නියෙන් දැල්වෙන්නට වෙහෙසෙන කල "මාගේ උරුමය භුක්ති විඳින්න" යන හඬක් එක් දිනක දී සිය හද තුළ සන්දුනි. "ජේසු ස්වාමී දරුවන්ගේ උරුමය කුමක්ද" යි මෙනෙහි කරන්නී එය උන්වහන්සේගේ දුඃඛප්‍රාප්තිය බව ඈ සිතා ගත්තා ය.

මීට අවුරුදු දෙකකට පසු, එනම් වර්ෂ 1868 දී පමණ හෙලේනා ගාර්සියා පියතුමන් විසින් ස්ථාපිත ධර්ම පංතියට ඇතුළු වූවා ය. එවකට ඇගේ ආත්මික තත්ත්වය එම පියතුමා මෙලෙස විස්තර කරයි. "හිරිහැර නිසාවත් ඇගේ සහෝදරයාගෙන් ලත් උග්‍ර දණ්ඩනයන් නිසාවත් ඈ කලකිරුණේ නැත. ගෙදර දී ලැබුණු කම්කටොලු පමණට ඇගේ ශ්‍රද්ධා භක්තිය වර්ධනය විය. තමා ත්‍යාජකර ලෝකයා ගරු

කරන සියල්ලම පිළිකුල් කළා ය. පාසැලට කවදාවත් නොගිය නමුත් ස්වකීය සහචරියන්ගේ ආධාරයෙන් අකුරු ඉගෙන ගත්තා ය. දැන් දහම් පොත් පත් කියවන්නට හැකි වෙතත් අකුරු ලිවීම නොදන්නී ය. ඈ පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබගත් දින පටන් විටින් විට එම ජීවනදායක භෝජනයෙන් සම්පූර්ණ වූවා ය. ඇගේ වියේ කාන්තාවන් සිරිත් පරිදි පළඳින ආභරණ ඈ ඉවත් කළා ය. ජේසු තුමන්ට ප්‍රේම කිරීමේ අභිලාෂය දිනපතා වඩ වඩා ප්‍රකාශ වී ඇගේ ආත්මික පියාණෝ ද ඇට අප ශුද්ධවූ ආගමේ වන්දනීය සත්‍යයන් ගැන භාවනා කිරීමේ පිළිවෙළ හෙවත් ශුද්ධවන්තයන්ගේ ශික්ෂා මාර්ගය අවබෝධ කර දුන්නාහ. මේ දහම් විනයෙහි කොපමණ ශීඝ්‍රයෙන් ඈ පුහුණු වූවා ද කිවහොත් ඇගේ සාමාජිකයන්ට පවා ඈ ආදර්ශයක් වූවාය." (වාර්තාව)

වර්ෂ 1869 දී පමණ මාපිලකු විසින් ඇගේ කකුලේ මාපට ඇඟිල්ල දෂ්ට කරන ලදින් ඈ මරණාසන්න වූ නමුත් මතුරාපු බෙහෙත්, තෙල් ආදිය මැරෙතත් නොගන්නා බව තරයේ කියා සිටියා ය. අන්තිම ආලේපය ලබාගෙන ටික කලකින් ඇයට සුවය ලැබුණි.

## කල්වාරි දර්ශනය

වර්ෂ 1870 සිට හෙලේනාගේ ජීවිතය අමුතු විලාසයක් දරයි. ඇගේ සිතෙහි තිබුණු ශාන්තිය වරින් වර නැති විය. භයානක කිලුටු සිතිවිලි සහ ස්වකීය ආත්ම ගැලවීම ගැන සැක සංකා ද රළ පතර මෙන් පැන නංගේ ය. අහසත් පොළොවත් ඝන අන්ධකාරයකින් වැසී තිබෙන කල මිනිස් ලොව හටගන්නා භය භීතිය සේ මහා භයක් ඇගේ හද ආවරණය කර ගත්තේ ය. දුකින් දෙවියන් වහන්සේට යාච්ඤා කළා ය. එක් දිනක් ඇගේ ආත්මීක පීඩා උග්‍රව පවතින වේලාවේ දී ජේසුස් ස්වාමි දරුවෝ ඇගේ මනස් ඇසට පෙනී අස්වසා "නුඹ යක්ෂයාගෙන් හිරිහැර විඳින විට ද සංකා තාපයෙන් පෙළෙන විට ද, මම ළඟ සිටියෙමි. මත්තටත් නුඹේ පීඩාවල දී ළඟ සිටින්නෙමි" යි වදාළ සේක. (දින පොත 1870 අගෝස්තු 14) නැවතත් ජේසුස් ස්වාමි දරුවෝ චෛතසිකාකාරයෙන් දර්ශනය වෙමින්, ඈ අගනා පළඳනාවකින් සරසා, ඇගේ හිස පිට මල් වඩමක් තබා ඇට වද වේදනා විඳින්නට සිදු වන බව ද, තමන් වහන්සේගේ දුඃඛ ප්‍රාප්තියට පංගුකාරියක් විය යුතු බව ද දන්වා වදාළ සේක. ( එම සැප්තැම්බර් 11)

ඉන්පසුව ඇට තදබල උණ රෝගයක් වැලඳී අත පය අවලංගුව, උගුර ඉදිමී ඇතැම් විට සිහිසන් නැතිව ගොස් තද වේදනා වින්දා ය. ඈ මරණාසන්නව සිටින්නේ යැයි බොහෝ දෙනා කල්පනා කළෝ ය. එහෙත් ඈ මැසිවිල්ලක්වත් නොදොඩා ඉවසීමෙන් සියල්ල දරාගෙන එය දෙවියන් වහන්සේට ප්‍රසන්න යාගයක් කොට ඔප්පු කළා ය. දේව දයාව නිසා ඇගේ ආත්මය ප්‍රීතිවෙන කල අපාගත සතුරා වන යක්ෂයා නොයෙක් උපායයන් මගින් ඈ රවටා මංමුළා කරන්නට උත්සහ කළේ ය. වරක් ඌ ඇට මුද්දක් පෙන්වා "නුඹ මෙය පැළඳගෙන මට අයිති වෙයන්නැ" යි ඇවටිල්ලෙන් ඉල්ලා සිටියේ ය. ඒ උපාය නිශ්ඵල වූ විට ඇට හොඳට තළා පෙළා පලා ගියේ ය. (එම ඔක්තෝබර් 4)*

මීට ස්වල්ප දිනකට පසු භාවනාවේ සමවැදී සිටින විට ජේසු ස්වාමිදරුවෝ ඈ අමතා, තමන් වහන්සේගේ සිරි ලය පෙන්වා "මාගේ උරුමය භුක්ති විඳපන්නැ"යි වදාරමින් එය සිපාචාර කරන්නට ඇට අණ කළ සේක. ඈ ද භය භක්තියෙන් එසේ කළා ය. මේ සිද්ධිය ඇගේ මසැසට නොපෙනුණ නමුත් එදා සිට ඇගේ හෘදය ආයුධයකින් සිදුරු කළාක් මෙන් ද, හිස පිට කටු ඔටුන්නක් සවිකළාක් මෙන් ද හැඟුණි. එයින් තද ශාරීරික වේදනාවක්ද ඇති විය. (එම ඔක්තෝබර් 12 ) දින ස්වල්පයක් ගත වූයෙන් නළලෙහි ද, දකුණු ළයෙහි ද ලේ බින්දු කිහිපයක් පෙනුණි. එහෙත් මේ ලකුණු යක්ෂ මායමකින් සිදුවීදෝ හෝයි සැක සිතමින් ඕ භය වූවා ය. ජේසු ස්වාමිදරුවන්ගේ ශුද්ධවූ උරුමය නම් උන්වහන්සේගේ දුඃඛ ප්‍රාප්තිය බව ඇට තවම නොතේරුණ හෙයිනි. (එම නොවැම්බර් 1, 5)

නොවැම්බර් මස 8 වන දින දේවස්ථානයේ සිට ගෙදර යනවිට සර්පයකු විසින් නැවතත් ඇගේ දකුණු පාදය දෂ්ට කරන ලදින් ඈ සිහි නැතුව ගොස් මරණාසන්න වූවා ය. අන්තිමාලේපය ලබා ගත්තායින්

---

* හෙලේනාගේ සහචරියන් අතර එකල යක්ෂ මායමට අසුවූ හොර තාපසිකාවක් ද සිටියාය. ඈ දේව දර්ශන ගැනත් විශේෂ වරප්‍රසාද ගැනත් බොරු ගොතාගෙන ගාර්සියා පියතුමන් ද අනිත් තාපසිකාවන් ද මුළා කරන්නට තැත් කළා ය. හෙලේනාට ශ්‍රී වණ කැළැල් සටහන් ලැබුණු බව දැනගත් විට ඇට ද එවැනි ප්‍රසාදයක් අත්වී යැයි පෙන්වන්නට අත පය තුවාල කරගත්තා ය. ඇගේ කපටිකම ගැන ගාර්සියා පියතුමා සිය දිනපොතේ සටහන් කරයි.

පසු දවසකින් ඈට සුවය ලැබුණේ ය. එවිට ඈ මේ දර්ශනය දිටී. ජේසු ස්වාමිදරුවෝ රජකු මෙන් ඈට වද දුන් යක්ෂයාට පලායන්නට අණ කළ සේක. ඉන්පසු උන්වහන්සේ ඈ අතින් ඔසවා නිරා මෘගයා පයින් පාගන්න ඈට වරය දුන් කල ඌ ඇගෙන් ඈත්වීමට අවසර ඉල්ලා කන්නලව් කළේ ය. (එම නොවැම්බර් 20) මෙලෙස ජේසු ස්වාමිදරුවෝ තමන් වහන්සේගේ දුඃඛප්‍රාප්තියට ඈ පංගුකාරියක කරන්නට පෙර, සුමිහිරි වචනවලින් හා ප්‍රසන්න දර්ශනවලින් ද ඈ ශක්තිමත් කර සනසා වදාළ සේක.

## "ජේසු ස්වාමිදරුවන්ගේ උරුමය"

1870 දෙසැම්බර් මස 8 වන දින නිර්දෝෂ මංගල්‍ය පූජාවෙන් පසු ගෙදර ගිය සැණෙහිම කදිම හැඟීමක් ඈ වෙත පහළ විය. ඇගේ උරහිස මහත් බරකින් ඔබා දමුවාක් මෙන් ද ඇගේ ඈට සැකිලි පොඩිකර දමුවාක් මෙන් ද ඈට දැනුණි. එයින් හටගත් වේදනාව නිසා ඈ අඩ සිහියෙන් වැදහොත්තා ය. එකල ජේසු ස්වාමිදරුවෝ ඇගේ මනසට දර්ශනය වෙමින් අඟල් දෙකක් පමණ දිග ඇණ තුනක් ඈට දක්වමින් එය සිපාචාර කරන්නට අණ කර "මාගේ උරුමය මෙලොවෙහි ලබා ගත්තායින් පසු, මොක් පුරයෙහි ද එය භුක්ති විඳින්නෙහි" යයි වදාළ සේක. මීට අට දිනකට පසු ස්වාමීන් වහන්සේ විසින් ශුද්ධවූ කුරුසිය ද ඈට පෙන්වන ලදී. මේ ලකුණුවලින් ඈට වැටහුණේ දුක් විඳීමට තමන්ට නියමව තිබුණු බවයි. (ලුහුඬු සටහන්)

මේ දුඃඛ ප්‍රාප්තියට ගෞ. ගාර්සියා පියතුමාම අපට විස්තර කෙරෙත්වා "මේ අවුරුද්දේ (1870) දෙසැම්බර් මාසයේ සිට ජේසු ස්වාමිදරුවන්ගේ දුඃඛ ප්‍රාප්තිය අනුව යයි කිව හැකි වේදනා කලාපයක් ඈ වින්දා ය. සෑම සිකුරාදාම තුන්වරක් කුරුසියේ ඇණ ගැසුම් කන ලද්දී ය. මේ පුදුම දෙය සිදුවන්නේ මෙසේ ය. බ්‍රහස්පතින්දා සවස 7.00 ට, ඇය ගුප්ත බලයකින් නිතැතින්ම බිය හෙළන ලදුව, අත් පා බන්ධන ගත වූවායින් පසු දෙවරක් මිනිත්තු 20ක් පමණ කස පහරවල් විඳින්නී ය. ඉන්පසුව ඇතැම් විට පැය 1/4 ක් පමණ පරවසම් වන්නී ය. සිකුරාදා උදේ 6.00 ට පමණ බර වූ කුරුසයකින් මෙන් මඩන ලදුව හදිසියෙන් ම බිම වැටී පැය 1/2 ක් පමණ නැගී සිටින්නට නුපුළුවන්ව මුහුණින් වැටී සිටින්නී ය. ඈ පිට පැට වී තිබෙන බර ඈ ඔසවන්නට තැත් කරන බව පවා හොඳාකාර දැනිණි. නැගිට්ටාට පසු පැය දෙකක් පමණ පොත්

පත් කියවන්නට පවා හැකිවිය. පෙරවරු නමයට නැවතත් හදිසියෙන්ම බිම හෙළන ලදුව කුරුසයක් පිට බාවා අත් පා ඇණවලින් සවිකළාක් සේ දිගා වී සිටින්නී ය. මෙවැනි අවස්ථාවන්හි මෛර්යදාවට නොගැළපෙන විලාසයක් ඈ කෙරෙහි නොදක්නා ලදී. කුරුසයේ ඇණගැසුම් කා කොපමණ වේලාවක් සිටින්නීදැයි ස්ථිරව නොකිව හැක. ඒ කාල සීමාව අඩු වැඩි වෙන හෙයිනි. ඈ පරවසම් වූ අවස්ථාවන්හි වද වේදනා වින්දේ ස්වල්ප වේලාවක් පමණ ය. එසේ නූනොත් බොහෝ වේදනා වින්දා ය. දෙවන වරට ඇණගැසීම සිදුවූයේ දවල් 12.00 ට ය. තුන්වන වර පස්වරු තුනට ය.

"1870 දෙසැම්බර් මාසයේ සිට සෑම සිකුරාදාම පෙර කී පරිදි තුන් වරක් පුදුමාකාර ලෙස කුරුසේ ඇණ ගසනු ලද්දී ය. එහෙත් මෙකල පාදයන්ගෙන් ලේ ගලාගියේ නැත. පටන්ගැන්මේ සිට දකුණු ළයෙන් පමණක් ලෙය පිට විය. 1871 මහ සිකුරාදා දින සිට අත්වලින් ද ලේ ගලන්නට විය. මෙය සිදුවුණේ එක විධියකට නොවේ. ඇතැම්විට අතින් පමණක්, ඇතැම්විට හස්තයෙනුත්, පාදයෙනුත් ලේ වැහුණි. ඇතැම්විට පළමුවන දෙවන වාරවල දී පමණකි. ඇතැම්විට තුන්වන වාරයේ දී පමණෙකි. මෙතැන් සිට මේ විස්මයජනක ඇණගැසීම් සෑම සිකුරාදාම සිදුවූවත්, ස්වකීය ආත්මික පියාණන්ගෙන් හෝ රදගුරුතුමාගෙන් හෝ යම් කාල සීමාවක් තුළ දී එසේ සිදු නොවීමට අණ ලැබුණ කල දුඃඛ ප්‍රාප්තියේ පිටස්තර ලකුණු අවිද්‍යාමාන විය."

මාසයක් පමණ ඈ වින්ද වේදනා ඇගේ ආත්මික පියාණෝ ද එතුමන් විසින් එවැනි වේලාවල දී ඈට උපස්ථාන කරන්නට පත් කරන ලද සහචරියක් ද පමණක් දැන සිටියාහ. මේ තාපසිකාව අවංක, හිතෛෂි, ආත්මික කරුණා පිළිබඳ මනා දැනුමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තියකි. හෙලේනාගේ මව්පියෝ ද සොහොයුරියෝ ද මේවා නොදැන සිටියෝ ය. එහෙත් වර්ෂ 1871 නොවැම්බර් මාසයේ සිට දිනපතාම තුන් වරක් කුරුසේ ඇණ ගැසීමේ දුක් වේදනා වින්ද නිසා ආහාර වැළඳීමට පවා අපොහොසත් වූ විට පමණක් ඇගේ රහස ඔවුන්ටත් ප්‍රකාශ වුණි. පටන් ගැන්මේ දී ඔවුන් සිතා ගත්තේ ඈ යම්කිසි රෝගයකින් පෙළෙන බවය. ඒ නිසා ඔවුහු ඈට බෙහෙත් හේත් දීමට උත්සාහ කළෝ ය. ඔවුහු හරි සිද්ධිය දැනගත් විට භය වී ඈට හිරිහැර නොකර ඇගේ සොහොයුරියන්ගෙනුත් සහචරියන්ගෙනුත් උපස්ථානය ලබන්නට ඈට ඉඩ දුන්නා හ.

මෙවැනි අපූර්ව සිද්ධියක් ගමේ රටේ ආරංචි වීම වළක්වන්නට බැරි නිසා ගැමියන් අතර ඒ ගැන නොයෙක් කතා ඇති විය. එය සිය ඇසින් දක තම ආශාවන් සංසිඳුවා ගැනීමට ඔවුහු තැත් කළහ. ඔවුන්ගේ දෙඩීම් හා කලාපිලා මැඩලීමටත් හෙලේනාගේ කීකරුකම විමසා බැලීමටත්, දුඃඛ ප්‍රාප්තියේ පිටස්තර ලකුණුවලින් හා පරවසම් වීමෙන් ද සති තුනක් වැළකී සිටින්නට ඈට ආත්මික පියතුමා අණ කළේ ය. මේ අණට ඈ සම්පූර්ණයෙන් ම කීකරු වූවා ය. මේ සති තුනේ දී කිසියම් ආහාරයක් නොවැළඳූ නමුත් ළමුන්ට උපදේශය උගැන්වීම සඳහා බෝලවත්තට හැතැප්මක් දුර පයින්ම ගියා ය.

අණට යටහත් කාලසීමාව ඉකුත් වූ වහාම පෙර සේ පිටස්තර ලකුණු ඇතුව බ්‍රහස්පතින්දා සිකුරාදා දිනවල වේදනා වින්දා ය. එහෙත් ආගමන කාලයේ දී සති තුනක් ම දිනපතා කුරුසේ ඇණ ගැසීමේ කටුක වේදනා වින්දා ය. තවද සෑමවිටම පාහේ තුවාලවලින් ලේ වැහිණි. එම අවුරුද්දේ නත්තලට පෙර දින තමන්ට සුවය තිබුණ නිසාත් එදින බ්‍රහස්පතින්දා නූන බැවින් දුඃඛ ප්‍රාප්තියේ සංඥාවක්වත් නොතිබුණ නිසාත්, කල්වේලා ඇතුව රෑ දොළහේ පූජාව සඳහා දේවස්ථානයට පැමිණියා ය. රාත්‍රි දහයට පමණ ඇගේ අත් පා යම්කිසි ගුප්ත බලයකින් බඳිනු ලදූයි පෙනිණ. ඇගේ හිතෛෂි සහකාරී මේ දක වහාම ඈ "සංක්‍රිස්ති " කාමරයට කැඳවාගෙන ගියා ය. මෙතැන දී ඈ කුරුසේ ඇණගැසීමේ දුක් වේදනා සියල්ලම වින්දා ය. කැළැල්වලින් ලේ දහරා ගලා ගියේ ය. එදින දේව මෙහෙය සඳහා මහා පිරිසක් පැමිණ සිටි හෙයින් හෙලේනා ඔවුන්ගේ දර්ශනයෙන් වැළැක්වීම හාත්පසින් ම නුපුළුවන් වැඩක් විය. තවද ඈ වෙනදාට වඩා දීර්ඝ කාලයක් එනම් රෑ දොළහේ පූජාව දක්වාම පරවසම්ව සිටියා ය. එහෙත් ඕ දිව්‍ය පූජාවට සහභාගී වීමට පැමිණියා ය. ඉන්පසු ලංකාවේ ඈත පළාත්වලින් පවා මහා ජන පිරිසක් ඈ දකීම සඳහා ගෝනාවිලට රැස්වූහ. " (වාර්තාව)

## ප්‍රවෘත්තිය පැතිර යාම

සැබෑ දෙවිවූ ද සැබෑ මනුෂ්‍යයා වූ ද ජේසු ස්වාමිදරුවාණන් අපගේ ගැළවීම උදෙසා වින්දා වූ දුඃඛ ප්‍රාප්තියේ විලාශයක් යම් මනුෂ්‍යයකු කෙරෙහි ප්‍රකාශ වීම මනුෂ්‍යයන්ගේ සිත් කම්පා කරවන

දර්ශනයකි. මෙවැනි දර්ශනයක් මෙලොවෙහි ප්‍රත්‍යක්ෂ වන්නේ කලාතුරකිනි. ශුද්ධවූ සභාවේ ඉතිහාසගත ලිය කියමන්වලින් පෙනෙන සැටියට මෙබඳු දේව වරමක් පළමුවරට ලබා ගැනීමට භාග්‍ය ලද්දේ ශු. ප්‍රැන්සිස්කු අසීසි තුමා ය. ඉන්පසු තුන්සිය විසි එක් දෙනෙකුට පූර්වෝක්ත විශේෂ වරප්‍රසාදය දේව දයාවෙන් අත්වූ බව සාක්ෂ්‍යානුගතයි. ඉන්දු දේශයේ ගෝවා නුවර ශුද්ධවූ මොනිකා වහන්සේගේ කන්‍යාරාමයේ නේවාසිකව සිට 1683 දී පරලෝක ප්‍රාප්ත වූ භක්තිමත් තාපසිකාවකට ද මේ උතුම් වරම් ලැබී තිබුණේ ය. (History of Cath. Church in India by M. D'sa, Vol.I.p. 224)දේව වරමින් මෙසේ සිදුවන තුවාල සටහන් ශාරීරික දෝෂයකින් හෝ යම් පිටස්තර හේතුවකින් හෝ හටගත් තුවාල මෙන් පැසවා කුණුවී දුර්ගන්ධය ඇති නොවන්නේ ය. තවද බේත් හේත් බලයකින් නොව දේවානුභාවයෙන් ම සුව වන්නේ ය. මෙවැනි සිද්ධීන් ගැන වෛද්‍යාචාරීන් ද වේද පණ්ඩිතවරුන් ද අසන ප්‍රශ්නයෝ බොහෝ වෙත්. ඒවා විසඳීම මේ කුඩා පොතට ප්‍රමාණවත් නොවන්නේ ය. එහෙත් මේ ගැන එක් කරුණක් සිත තබාගත යුතුය. එනම්, මෙවැනි අරුම පුදුම සිද්ධීන් පිළිබඳ ශුද්ධවූ සභාවේ ශ්‍රේෂ්ඨයෝ සුපරීක්ෂාකාරීව ක්‍රියා කරත්. මේවා ගැන තීරණයක් කිරීම නොවරදින සුලු ශුද්ධවූ සභාවටම හිමිවන කාර්යයකි.

ගෝනවිල ප්‍රවෘත්තිය ලක්දිව පැතිර යත් යත් සතර දිගින් සමූහයා රැස් කකා හෙලේනා දැකීමට පැමිණියහ. වෙසෙසින්ම බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල විශාල ජන සමූහයක් හෙලේනා විසූ ගෘහය අවට ගුම් භාගයෙහි අතුරු සිදුරු නැතිව රැස් වූහ. මෙය වැළැක්වීමට ඇගේ දෙගුරුන් ද සොහොයුරන් ද අපොහොසත් වූ බැවින් ගාර්සියා පියතුමා ඒ දෙදිනයන්හි ගෝනවිල දෙව්මැඳුර අසල කුඩා කාමරයක ලැගුම් ගැනීමට ඈට ඉඩ දුන්නේ ය. එයින්වත් ජන සමූහයා පසු බට නොවූ හ. කාරණාව දුරදිග යනු පෙර 1871 ඔක්තෝබර් මස 8 වන දින ගාර්සියා පියතුමා පදවියේ පාලනාධිපති වූ අතිඋත්තම දේවධර්මාචාර්ය ක්‍රිස්ටෝපර් බොන්ජන් ඕ. ඇම්. අයි. රාජගුරුප්‍රසාදිතුමාණන්ට තත් පුවත හසුනකින් දැන්වී ය. තවද මේ අතරතුර පෙරකී දෙදිනයෙහි හෙලේනා දැකීම තහනම් කර තිබෙන බව අවට මීසම්වල පූජාප්‍රසාදින් වහන්සේලා මගින් ප්‍රසිද්ධ කරවන ලදී. ගෝනාවිලට පැමිණි බොහෝ දෙනා ශ්‍රද්ධාකාමීහු වුවද, අපූර්ව දෙයක් දැකීමේ ගිජුකම ඔවුන් අතරේ මුදුන් පත් විය. එබැවින් ඇතැම් විට නියම

පිළිවෙළකට වත් උත්තමයන්ගේ අණකටවත් ඔවුහු අවනත නොවූ හ. අමුතු දෙය දැකීමේ පිපාසයෙන් පෙළෙන තුන්දහසක් පමණ ඉහිලුම් නැති ජන පිරිසක් එක් කුඩා නිවසක් වටළා ගත් විට ඇතිවන කල කෝළහාල, ඇනුම්, බැනුම්, ගුටිබැට හුවමාරු කර ගැනීම් ආදී දුර්දාන්ත ක්‍රියා අප්‍රමාණ බව නොකිවමනා ය. එහෙත් හෙලේනාගේ දුඃඛ ප්‍රාප්තිය දර්ශනය කළ කිහිප දෙනෙකුන් අතරෙන් දැඩි පවුකාරයින්ගේ පවා සිත් සතත් ඉටි සේ මොළොක් විය. වරක් ඇයට වද දුන් දෙටු සොහොයුරා ඇයගේ ක්ෂාන්ති ජීවිතයත් පුදුම විලාශයත් දැක භයින් තැතිගෙන යහපත් ජීවිතයක් ගතකරන්නට අදහස් කරගත්තේ ය. අවට ගම්වල සිටියා වූ අන්‍යාගමිකයෝ පවා තමන්ගේ වැරදි මත හැර පියා සත්‍ය සභාව වැලඳ ගත්තෝ ය.

බෝලවත්ත අපූරු පුවත ගැන ලක්දිව පුවත් පත්වල පවා වාද විවාද ඇති විය. ඇතැමෙක් "අදෝ කපුරාලගේ දූ විජ්ජාකාරියක, යක්ෂාවේශ වී සිටිතැ" යි දෙඩූහ. වේද භේදකාරයෝ "රෝමාණුකාරයන්ගේ විමති විනෝදයක් නොහොත් ඔවුන්ගේ පූජකයන්ගේ ප්‍රයෝගයකැ" යි පරණ පදයටම තෙපලූහ. එහෙත් ශුද්ධවූ සභාවේ ශ්‍රේෂ්ඨයෝ සාධාරණ පරීක්ෂණයක් පවත්වනතුරු යථා ප්‍රවෘත්තිය පිළිබඳ නිශ්චය නොකළෝ ය. එපමණක් නොව මෙබඳු තීරණයක් දෙවා වදාරන තුරු හෙලේනා දකිනු වස් බෝලවත්තට යාමත්, එතුමී ගැන සිද්ධිය සැබවින් ම දේව බලයකින් වූ බව ප්‍රකාශ කිරීමත්, තහනම් කර යාපනයේ රාජගුරු තුමන් විසින් වර්ෂ 1872 කේ ජනවාරි මස 18 වන දින නිවේදනයක් ද ප්‍රකාශ කරන ලදී.

ඉහිලුම් නැති ගැමියන් මැද මේ සා බරපතළ කාරණයක් විසඳීම යුතු නැති නිසා එතුමියටත් ඇයගේ සහචරියටත් ගාර්සියා පියතුමන් හටත් කුරුණෑගලට පැමිණෙන ලෙස රාජගුරු තුමාණෝ මාර්තු මස 3 වන දින දී අණ කළහ. ඇගේ මව්පියෝ ඊට විරුද්ධ වූවත් හෙලේනා වහාම ශ්‍රේෂ්ඨයාගේ අණට යටත් වූවාය. කුරුණෑගල ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ නිවසන විට ද පෙර සේම දුඃඛ ප්‍රාප්තිය සිදුවිය. එතැන දී හෙලේනා පිළිබඳ පැවැත් වූ පරීක්ෂණය ද්විප්‍රකාරයි. ස්වභාව ධර්ම ශාස්ත්‍රය අනුව කරුණු විසඳීම එකල ප්‍රධාන වෛද්‍යාචාර්ය වරයෙක් වූ ඇම්. ඩී. උපාධිධාරි ඩයස් දොස්තර මහතාට භාර විය. එතුමා කතෝලික සභාවට අයත් නොවූ නවීන විද්වතකු වූ බැවින් හෙලේනා කෙරෙහි පාක්ෂික භාවයක් පෙන්වතැයි සිතීමට පවා ඉඩ

නොතිබුණේ ය. දේව ශාස්ත්‍රය අනුව විසර්ජනය රාජගුරු තුමන් විසින්ම ඉතා තීක්ෂණ ලෙස පවත්වන ලදී.

## වෛද්‍යාචාර්යතුමාගේ වාර්තාව

වෛද්‍යාචාර්යතුමා තුන් වරක් ඇය පරීක්ෂා කළේ ය. පළමු වර පරීක්ෂණය 1872 මාර්තු මස 13 වන දින සිදු විය. අප්‍රියෙල් මස 9 වන දින එතුමන්ගේ වාර්තාව රදගුරුතුමන්ට පිළිගන්වන ලදී. එයින් ස්වල්පයක් මෙහි බහාලමු. "ඇගේ (අත්වල) අල්ල මැද අඟල් 3/4ක් දිග සහ අඟල් 1/4ක් පළල ඇති කැළැල් දෙකක් තිබුණේ ය. එහි හම සුවවුණ තුවාලයක හම මෙන් සිනිඳුව ද මදක් කාලවර්ණව ද පැවතිණ. මේ ලපය මැද රුධිරය කැටිගැසීමෙන් සෑදුණු අඟල් 1/2 ක් සහ 1/4 ක් දිග පළල ඇති දැඩි වටගුරු පිඩෙකි. ........ එක එක අතේ පිට පැත්තේ ද අල්ලේ තිබුණ ලපයට සමානව සහ ඊට හරි කෙළින් ලපයක් විය. අත්වල කැළල සමාන කැළැල් සතරක් පාදවල ද තිබුණේ ය. මේවා අත්වල කැළැල්වලට වඩා මදක් විශාල වුව ද අනෙක් ලක්ෂණ ඒ සමානමය. දකුණු ලයේ පියයුරට මඳක් පහළින් පිට අතට හරස්ව ගිය අඟල් දෙකක් දිග ඇති ලපයෙකි. මෙහි හම දෙදරී ගියාක් මෙන් පෙනිණ. එය අඟල් 1/2 ක් පුළුල් වූ කළුපාට සිනිඳු සම්පොත්තකින් ආවරණය වී තිබුණේ ය."

"ඊට පසුවදා නැවතත් හෙලේනා සෝදිසි කළෙමි. පස්වරු තුනට පමණ ඕ සංසුන්ව හිඳගෙන සිටියාය. එවිට ඇයගේ අත් පා වලින් ලේ ගලා යාමක් නොතිබුණේ ය. මා සිටියේ ඇගේ කාමරයට යාබද කාමරයෙහි ය. කාමර දෙක අතර එකම දොර විවෘත කර තිබුණේ ය. තුනහමාරට පමණ හෙලේනාට සිහිසන් නැතිවීගෙන යන බව ඇගේ සොහොයුරි දන්වා සිටිය බැවින් වහාම මම ඇය උන් තැනට පැමිණියෙමි. ඕ අත් පා දිගු කරගෙන උඩුකුරුව බිම දිගා වී සිටියා ය. ඇළපතේ සිට අත දක්වා දුර ප්‍රමාණය අඟල් 18 ක් විය. පිට අල්ල පොළොවට සවි වී තිබුණේ ය. කකුල් දෙක ළංව දකුණු පාදයේ යටි පතුළ වම් පාදය පිට ද, දකුණු පාදයේ විලුඹ වම් පාදයේ යටි පතුළට තද වී තිබුණේ ය. අල්ලෙන් ද, දකුණු පාදයේ උඩ පැත්තෙන් ද, වම් පාදයේ යටි පැත්තෙන් ද, ලේ ගලා ගියේ ය. රුධිරය මතු වුණේ අත් පාවල

පිහිටා තිබුණු වියලි ලේ පිඩුවලිනි. ලෙයින් අඩක් තද රක්තව ද අඩක් තද කාලවර්ණව ද, පැවතිණ. එක එක තැනින් ගලාගිය ලේ ප්‍රමාණය ඩ්‍රෑම් (හෙවත් අවුන්ස 1/8) එකකි. මුලදී ඇයට මදක් සිහිය තිබුණ නමුත් කඩිනමින් සිහිය සම්පූර්ණයෙන්ම නැතිවුණේ ය. දෙ ඇස පියවී තිබුණේ ය. එහෙත් වැඩි වැරයක් නැතිව ඇසිපිය විවෘත කරවන ලදී. අක්ෂි බෝලය උඩු අතට පෙරලී තිබුණ නිසා දක්නා ලද්දේ සුදු ඉංගිරියාව පමණෙකි.... හුස්ම හෙළිම හා නාඩිය (විනාඩියකට 100 බැගින්) මදක් ශීඝ්‍රව පැවතිණ. 3.50ට හෙවත් විනාඩි 20කට පසු ඈ ක්‍රමයෙන් සිහිපත් වූවා ය. ඇස් ඇර වට පිට බලා වාතාශ්‍රය මද කාමරයක සිටින්නියක සේ කටින් හුළං පිඹින්නට වන්නී ය. ඉන්පසු දෙ අත යම් බලයකින් පොළොවෙහි සවිකර තිබුණාක් මෙන් වෑයමින් එසෙව්වා ය. ඇඟපත හා කකුල් මදක් සොළවා පාදයන් එකටෙක ගැටී තිබුණාක් මෙන් ආයාසයෙන් බේරාගත්තායින් පසු ඇයගේ සොහොයුරියගේ සහ සහචරියගේ ආධාරය ඇතිව කෙළින් වී ඉඳගන්නට තැත් කළා ය. පිට අල්ලෙන් ද, වම් පාදයේ යටි පතුලෙන් ද, ලේ වැහී තිබුණ බවත්, ඇය සයනයට වී සිටිය පැදුර රුධිරයෙන් රක්ත වී තිබුණ බවත් එවිට මම දිටිමි. ඈ දිගාවී සිටිය කල මේවා පරීක්ෂා කර බැලීමට මට නුපුළුවන් විය. මේ අවස්ථාවේ දී ඇයගේ ළයෙනුත් හිසෙනුත් ලේ ගලාගියේ නැත. ඇය දුර්වලව සිටිය නිසා පානය කිරීමට දිය ටිකක් ඉල්ලුවා ය."

පසුවදා තුන්වන වරටත් ඇය පරීක්ෂා කළෙමි. උදේ 7ට හෙලේනා මූර්ජාවට පත්වූවා ය. බොන්ජන් රාජගුරුතුමන් සමග ඈ කතාකරමින් සිටිද්දී මා පැමිණීමට ස්වල්ප වේලාවකට පෙර එසේ සිදු වූ බව එතුමාණෝ මට දැනුවූහ. ඈ සිහිසන් නැතිව බිම වැටී වම් පසට හැරී අත් දෙක පහතට දිගුකරගෙන සිටියා ය. වම් අතේ මැණික් කටුව පිට දකුණු අතේ මැණික් කටුව තදින් පිහිටියේ ය. කකුල් දෙක එකටෙක ළංව ද ඍජුව ද මඳක් පෙරට නෙරවා ද, තිබුණේ ය. ඇය වැටුණ තැන ලේ බින්දු එකක් දෙකක් දක්නා ලදී.සිරස පරීක්ෂාකර බැලූ කල හිස් කබලේ තුන් පොළකින් ලේ වැහෙනවා දුටිමි. ඉන් නළල පසේ කෙස් රොද මැද දෙපොළකින් ලේ ස්වල්පයක් වෑස්සුණේ ය. හිස මුදුනට මඳක් පහළින් දකුණු පසට ලේ බහුලව පිට වී ගෙළ දක්වා ගලා ගියේ ය. අත් දෙක වෙන් කිරීමට තැත් කළ නමුත් ඒවා තදින් ගැටී තිබුණ නිසා ඒ ප්‍රයත්නය නවත්තන්නට සිදුවිය. මේ අවස්ථාවේ දී අත් පාවලින් හා ළයෙන් ද ලේ ගලා නොගියේ ය. පෙර කී තත්ත්වය

පස්වරු 7.15 දක්වා එනම් සම්පූර්ණ විනාඩි පසළොසක් පැවතුණේ ය. ඉන්පසු ඈ ක්‍රමයෙන් සිහිය ලැබ ආයාසයෙන් අත් දෙක නිදහස් කරගත්තා ය. මේ ළඳ වෙතෙහි හෝ ඇගේ සහකාරියන් වෙතෙහි හෝ යම්කිසි ප්‍රයෝගයක් නොතිබුණු බව මට ප්‍රත්‍යක්ෂ විය." (වෛද්‍යාචාර්යතුමන්ගේ වාර්තාව)

මේ පෙර දක් වූ කොටසේ විස්තර කරන ලද දුක් කලාපයෙන් පසු හෙලේනාගේ පිටෙහි කස පහරවලට සමාන ලකුණු කිහිපයක් තිබුණ බව එවකට කුරුණෑගල කන්‍යාරාමය භාරව සිටි මාරි ජොසපින් නැමති ශ්‍රේෂ්ඨ මවුතුමී සාක්ෂි දරන්නීය. (Missions des O.M.I. 1873. pp 389-391)

## පරවසම්වීම සහ දේව සාකච්ඡා

දුඃඛ ප්‍රාප්තිය වේලාවේ දී බොහෝ විට හෙලේනා පරවසම් වූවා ය. ඇගේ පංචේන්ද්‍රියන් ස්වාභාවිකානුරූපව ක්‍රියා නොකළ හෙයින්, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පස් අරමුණෙන් එළඹ උපදනා හැඟීමක් ඇය තුළ එවිට සිදු නොවී ය. එහෙත් ඇයගේ චිත්තානුකූල ශක්ති හෙවත් ධාරණ ශක්තිය ඥාන ශක්තිය, අධිෂ්ඨාන ශක්තිය යන මේවා බෙහෙවින් බල පෑවෝ ය. සිහිසන් නොමැති වූවකුගේ පඤ්චේන්ද්‍රියයන් හා චිත්තානුකූල ශක්තීහු ක්‍රියා නොකරත්. එබැවින් ඇය පරවසම් වූ කල අවට සිටින්නන් කරන කියන දෙය ඇයට හැඟුනේ නැත. ඇයගේ ශරීරයට පමුණුවන ලද වේදනාවක් වූයේ ද එය නොදනිණි. දිනක් ඇය පරවසම්ව සිටින කල අපර දිග වෛද්‍යාචාර්යවරයකු ඇය පරීක්ෂා කරන අටියෙන් "ඇමෝනියා" නැමති සැර බෙහෙතකින් පොඟවන ලද රෙදි කඩක් ඇයගේ නාසයට තබා ටික වේලාවක් ගත කළ නමුත් ඇයට සිහිය නොලැබුණේ ය. එවිට දොස්තර මහතා ඇයගේ මුඛයත්, නාසයත් එම රෙදි කඩින්ම මද වේලාවක් වසාගෙන සිටියේ ය. එවිටවත් ඇයට සිහිය නොලැබිණි. මෙයින් ඇය කෙරෙහි ප්‍රයෝගයක් නැති බව ඔප්පු වූ නමුත් බෙහෙතේ සැර ගතිය ඇඟට ඇතුළු වීමෙන් දෙදිනක් පමණ රෝගාතුරව ඈ වේදනා වින්දා ය. (දින පොත 1872 ජන. 5)

එහෙත් මෙබඳු අවස්ථාවන්හි දී පවා ඇගේ ආත්මීක පියාණන්

හෝ රාජගුරුතුමාණන් හෝ යම් අණක් දුන් විට, එය වහාම ඇට හැඟුණේ ය. වරක් දේව ශාස්ත්‍රය පිළිබඳ ඉන්දු දේශයේ කීර්තියක් දරූ **ගෞ. ගල්ලෝ එස්. ජේ. පියතුමා** හෙලේනා දැකීමට බෝලවත්තට පැමිණ දිව්‍ය පූජාව සිදු කරමින් ඇයට දිව්‍ය සත්ප්‍රසාදය ද දුන්නේ ය. ඊට පසුවදා සිකුරාදා දිනක් වූයෙන් කුරුසේ ඇණ ගැසීමේ දුඃඛ ප්‍රාප්තිය ඇ තුන් වරක් වින්දා ය. එය ගෞ. ගාර්සියා පියතුමා ද, ගෞ. ගල්ලෝ පියතුමා ද දර්ශනය කළහ. ඇ පරවසම්ව සිටින කල එයින් මිදීමට ගාර්සියා පිතුමා ඇට අණ කළේ ය. ඒ මොහොතේ දී ම පිටස්තර අන් කිසිවක් ගැන හැඟීමක් නොමැති වූ එතුමී ස්වකීය ආත්මික පියාණන්ට කීකරුව ඇස් ඇර පිබිදුණා ය. (වාර්තාව දින පොත 1871 ඔක්. 29)

පරවසම්ව සිටි වේලාවල දී හෙලේනාට දෙවියන් වහන්සේ නොයෙක් කාරණා ප්‍රකාශ කළ සේක. ඇද උන්වහන්සේ සමග චිත්තාකාරයෙන් සාකච්ඡා කළා ය. එලෝ වාසීන් සමග ප්‍රිය සම්භාෂණයෙහි යෙදුනා ය. භාවනා වේලාවල දී ද මෙබඳු ස්වර්ගීය වරප්‍රසාදයන් ඇට ලැබුණේ ය. එහෙත් මේවා ගැන ස්වකීය ආත්මික පියාණන්ට හා රාජගුරුතුමාණන්ට මිස අන් කිසිවකුට වචනයකින්වත් කතා නොකළා ය. රජුගේ රහස සඟවා තබාගැනීම යහපති. එහෙත් දෙවියන් වහන්සේගේ සත්කෘත්‍යයන් උච්චාරණය කිරීමත් ප්‍රකාශ කිරීමත් හොබනී ය. " (තෝබි.12.7)

ශ්‍රී වණ කැළැල් සටහන් ඇට පළමුවරට ලැබුණ සමයේ දී එය දේව වරමකින් අත් වූ දෙයක් ද නැතහොත් යක්ෂ මායමකින් සිදු වූ විකාරයක් ද කියා සැක සිතින් පෙළී "ස්වාමිනී මෙය ඔබවහන්සේගෙන් නොව මායමක් නම්, මාගෙන් ඉවත්වේවා. මෙබඳු භාරදූර සිද්ධියක් දුබල මම කෙසේ දරන්නෙම්දැ"යි කියා දෙවියන් වහන්සේට යාච්ඤා කළා ය. එවිට ජේසු ස්වාමිදරුවෝ ද දේවමාතා වහන්සේ ද එතුමීට දර්ශනය වී "භය නැතිව එය ලබාගනින්. නුඹ නොරැවටෙන්නෙහිය " යි කරුණාවෙන් වදාළ සේක. එවක් පටන් ඇය තුළ මේ පුදුම දෙය ගැන සැකයක් හට නොගත්තේ ය.

ලාංකික තාපසිකාවගේ පුදුම පුවත ප්‍රවෘත්ති පත්‍ර මගින් දැනගත් දොන් අන්තෝනියෝ නැමති ගාර්සියා පියතුමාගේ මිත්‍ර තාපසයෙක් යුරෝපයේ සිට ඇගේ යාච්ඤා පිහිට ඉල්ලා එතුමාට ලියා යැවී ය.

හසුන රැගෙන ඈ සොයා ගිය කල පරවසම්ව සිටිනවා දැක එතුමා සිය මිතුරා උදෙසා ද, වරක් රෝම නගරයේ දී තම සහචරයෙක් වූ දොන් ලුවිස් නැමති තවත් පැවිදිවරයකු උදෙසා ද යාච්ඤා කරන මෙන් ඇගෙන් ඉල්ලා සිටියේ ය. නැවත සිහිපත් වූ විට හෙලේනා සිනාමුසු මුහුණින් එතුමන් දෙස බලා, එතුමන්ගේ හිතවත් මිතුරු යුවල තවම පණපිටින් සිටින බව ද, දොන් අන්තෝනියෝ ශුද්ධවූ සභාවේ කීර්තිය උදෙසා බොහෝ යත්න දරන බව ද, එතුමන්ගේ කරදරවල දී ශුද්ධොත්ම පියතුමන්ගේ ශාන්තියත්, ශ්‍රද්ධාවත්, දයාවත්, ආදර්ශයක් කරගත යුතු බව ද, එතුමන්ගේ කාලය ළංව තිබෙන බව ද, දොන් ලුවිස් මහත් ජ්වලිතකමින් දේව වචනය දේශනා කරන බව ද, ප්‍රකාශ කළා ය. (දින පොත 1872, ඔක්. 19)

ශුද්ධවූ සභාවට එවකට පැමිණ තිබුණ පීඩන ගැනත්, ශුද්ධොත්තම පියතුමන්ගේ සතුරන් විසින් නිපදවන ලද හිරිහැර ගැනත්, ස්පාඤ්ඤ දේශයේ කතෝලික සභාවට සිදුවේගන එන විපත්ති ගැනත් හෙලේනා බොහෝ විට ප්‍රකාශන ලැබුවා ය. (එම 1873 මාර්තු 10: 1874 ජුනි 3) ඇගේ වද වේදනා සියල්ලම ශුද්ධවූ සභාවේ උන්නතියත් නිදහසත් උදෙසා ද පවුකාරයන්ගේ හිත් හැරීම උදෙසා ද දෙවියන් වහන්සේට ඔප්පු කළා ය. වරක් ශුද්ධවූ තෙරේසාතුමී ඈට දර්ශනය වෙමින් තම හෘදයෙහි සවිකර තිබුණ කටු පෙන්වා අසරණ ස්පාඤ්ඤය උදෙසා යාච්ඤා කරන්නට දුක්මුසු හඬින් ඈට නියම කළා ය. (එම 1874 සැප්. 7)

පරවසම්ව සිටින අවස්ථාවක දී ඈට ලැබුණ තවත් ප්‍රකාශනයක් ගැන ගාර්සියා පියතුමාට ඈ මෙසේ විස්තර කළා ය. "යුරෝපයේ භක්තිමත් මහේසිකාවක් වාසය කරයි. එතුමී දිනපතාම ජපමාලය කියා ශුද්ධෝත්තම පියතුමන් උදෙසා දෙවියන් වහන්සේට ඔප්පු කරන්නී ය. ශුද්ධවූ සභාවට විරුද්ධ පක්ෂයට සමගිව ශුද්ධෝත්තම පාප් වහන්සේට හිරිහැර නොකරනු වස් ස්වකීය සමිඳාණන්ගෙන් ඉල්ලා සිටී. ඒ ප්‍රාර්ථනාව ඔහු ප්‍රතික්ෂේප කළොත් ඈ ද, ඇයගේ දරුවන් ද, ඔහු අතැහැර යන බව එතුමී තරයේ කියන්නී ය. මේ මාසයේ දී ම රජවරු පාප්වහන්සේව විනාශ කරන්නට අදහස් කරතත්, එසේ සිදු නොවන්නේ යැයි ජේසුස් ස්වාමිදරුවෝ මට දන්වා වදාළ සේක. එහෙත් උන්වහන්සේ වධ වින්දාක් මෙන් ශුද්ධෝත්තම පියාණෝ ද වධ විඳින්නා හ. සතුරු බල සේනා එතුමන් නසන්නට

කරන උත්සාහයන් නිශ්ඵල වන්නේමය" යනුයි. (එම. 1872 ජූනි 28)

දස අටවන ශත වර්ෂයේ දෙවන කොටස යුරෝපයේ කතෝලික සභාවට හාත්පසින්ම කරදර සහිත කාලයක් විය. ස්වභාව ධර්ම ශාස්ත්‍රයට ආවැඩූ නවීන විද්වත්හූ ස්වභාව ධර්මයේ කර්තෲන් වහන්සේටත් උන්වහන්සේගේ ශුද්ධවූ ආගම ධර්මයටත් විරුද්ධව ප්‍රසිද්ධ වශයෙන්ම ක්‍රියා කළෝ ය. ආර්ථික සංවර්ධනය හා ජාතික මමත්වයත් මුදුන් පත් කරගත් ජන නායකයෝ ස්වර්ගයත් සාමයත් පිළිකෙව් කොට, ශක්තියට යුක්තිය වසඟ කළාහ. එබැවින් යුරෝපයේ මහා ජාතීන්ගේ රජවරු මරු පොරයට තිතොරම මාන බලමින් සිටියෝ ය. සමාදානයත් සාමයත් උගැන්වූ කතෝලික ධර්මය ඔවුන්ට අප්‍රිය වුණි. තවද සකල රාජ්‍යයන්හි විප්ලවයන් ඇති කරනු වස් දාමරිකයන්ගෙන් යුත් රහස් සමාගම්, භික්මුණකම ගැනත් නිදහස ගැනත් වැරදි මත රට තොට වැපුරූහ. මේ හේතුවෙන් යුරෝපයේ සෑම දේශයන්හි ශුද්ධවූ සභාවට විරුද්ධව ක්‍රියා කලාප ආරම්භ වී ස්පාඤ්ඤ දේශයේ සතුරු පිරිසක් බල පවත්වමින් පැවිදිවරුන් රටින් නෙරපා දමා ඔවුන්ගේ ආවාස ආරාම රාජ සන්තක කරගත්හ. එබඳු ආණ්ඩු ව්‍යාපාරයක් ඉතාලි දේශයෙහි ද පටන් ගන්නා ලදී. ශතවර්ෂ දහ අටක්ම ශුද්ධාසනයට අයිති වූ ජන ප්‍රදේශ සභා සතුරන් විසින් සොරා ගන්නා ලදී. 1870 දීනමවන පියුස් පාප් වහන්සේ වතිකාන මාලිගාවේ සිරගත වූ සේක. එකල ප්‍රංශ රාජ්‍යය පාලනය කළේ තුන්වන නැපෝලියන් රජතුමා ය. එතුමා ඇතැම් විට ශුද්ධාසනයට පක්ෂව ද ඇතැම් විට ඊට විපක්ෂව ද, වෙස් වලාගෙන ක්‍රියා කළේ ය. එවුජේනි බිසව භක්තිමත් ශ්‍රධාසාර උත්තමියක් වූයෙන් ස්වකීය සම්ද්‍රයාණන් හරි මග ගෙනයාමට තැත් කළා ය. එතුමිගේ උපදේශයන්ට කන් නොදී ක්‍රියා කිරීමෙන් රජතුමා සිය රට නසා රජ කිරුළ අහිමි කරගෙන විදේශිව 1873 දී පමණ කාලක්‍රියා කළේ ය. එමෙන්ම ශුද්ධාසනයේ පරවෙණිය පැහැර ගත් වික්ටර් එම්මානුවෙල් රජතුමා සුදනන්ගේ අපවාද ලබාගෙන මිය ගියේ ය. එහෙත් ඔවුන්ගෙන් පීඩන ලැබූ නමවන පියුස් පාප් වහන්සේ වතිකාන මාලිගාවේ සිරකරුවකු සේ විසූ නමුත් කතෝලික අකතෝලික දෙපක්ෂයේ ම ප්‍රභූන්ගෙන් සාදරයත් සම්මානයත් හිමි කරගෙන දෙතිස් වසරක් ශුද්ධවූ සභාව පාලනය කළායින් පසු 1878 දී ස්වර්ගස්ථ වූ සේක.

# රදගුරුතුමන්ගේ තීරණය

හෙලේනා පිළිබඳ කරුණු සියල්ල විභාග කළායින් පසු අති උත්තම රදගුරුතුමාණෝ වාර්තාවක් ලියා 1872 දී රෝම නගරයේ "ප්‍රොපගාන්දාෆීදේ" නැමති සාමයික මණ්ඩලයට පිළිගැන්වූහ. මේ වාර්තාවේ සඳහන් කරුණු හරියාකාර අප නොදන්නා නමුත් උන් වහන්සේ බැසගත් තීරණය කුමක්ද කියා වෙනත් ලිපියකින් දැනගත හැකිය. වර්ෂ 1872 මැයි මස 12 වන දින එතුමාණෝ ගාර්සියා පියතුමන්ට මෙසේ ලියූහ.

"මා පෙම්වත් පියතුමනි, බෝලවත්ත නැමති ඔබ මීසමට අයත් හෙලේනා නම් දරන තරුණියගේ ප්‍රවෘත්තිය පිළිබඳව නිර්නාමික අමන ලිපිකරුවන් විසින් ලියන ලද අනම් මනම් නිසා ඔබ සිත කැලඹුණේ යයි මම නොසිතමි. එහෙත් මාගේ මතය ප්‍රකාශ කිරීම මගේ යුතුකමකැයි හැඟීයයි. හෙලේනා ළඟ සති කිහිපයක් ම කුරුණෑගල කන්‍යාරාමයේ රඳවාගෙන ඈ පිළිබඳව තොරතුරු සියල්ලම තීක්ෂණ ලෙස විසඳා බැලූ නමුත්, ඇගේ චරිතයට විරුද්ධ වූ ද, ඈ සත්‍යකාමී දේව භක්තික උත්තමියකු බව නොපෙන්වන්නා වූ ද, කිසිත් ඈ වෙත ඇතැයි සිතීමටවත් කරුණක් නොදිටිමි. මම ඈ සාවධානයෙන් පරීක්ෂා කළෙමි. ඇය පරවසම් වීම කිහිප වරක්ම දිටිමි. ඇය පිළිබඳ සෑම දෙයක් ම එකක්වත් නෑර දීර්ඝ කාලයක් විනිශ්චය කළ නමුත් ඇගේ චරිතයෙහි වංචාවකවත් ප්‍රයෝගයකවත් සුළු කැළලක් පවා මට නොපෙණින. එපමණක් නොවේ. මට සෑමවිටම පහළ වූ හැඟීම නම් හෙලේනා සැබවින්ම උපා නොදත්, පිරිසිදු සිත් ඇති, භක්තිමත් දූරියක් බවයි. එදත් අදත් මාගේ මතය එසේම ය. ඈ පිළිබඳ පුදුමාකාර ප්‍රවෘත්තිය ගැන තීරණයක් කිරීමට තවම කාලය නොපැමිණියේ යැයි සිතමි. ඈ පරවසම්ව සිටින වේලාවලදී ඈ දර්ශනය කරන්ට අමුත්තන්ට ඉඩදීම ගැන තහනමක් මා විසින් පනවන ලදී. රෝමෙන් නිවේදනයක් ලැබෙන තුරු, පෙරකී අණසක හැර වෙන යම් නියෝගයක් රාජගුරු වූ මාගෙන් නිකුත් වීමට උවමනාවක් නැත. ඇත්තෙන්ම ඇගේ ක්‍රියා කලාපය දොස් පැවරීමට ඉඩක් නොතබයි. මේ ලිපිය අවසන් කරන්නට පෙර තවත් කරුණක් මෙහි සඳහන් කරන්නට කැමැත්තෙමි. ටික කලකට පෙර මා ඔබ මීසම බැලීමට පැමිණි අවස්ථාවේ දී ඔබ ආත්මික දරුවන්ගෙන් මහත් පිරිසක්, ප්‍රධානකොට පිරිමි පක්ෂය, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ. මීට පෙර එපමණ සමූහයක් කවදාවත්

නොපැමිණියහ. මේ පියකරු දර්ශනය දුටු මාගේ හද තුළ හටගත් ප්‍රීතිය මෙතැන දී ඔබට ප්‍රකාශ කරමි. අවුරුදු පහ, දහය, පහළොව, ඊටත් වැඩි කාලයක් පවා ශුද්ධවූ සභාවෙන් පිටව ආත්මික කටයුතු හැරදමා සිටියා වූ කාලකණ්ණි පවුකාරයන් කිහිප දෙනෙකු නැවතත් දෙවියන් වහන්සේ හා සමගි කිරීමේ භාග්‍යය එකල අපට ලැබිණි. තමන් වහන්සේ කුඩාවරයන්ගේ යාච්ඤා හා වද වේදනා ප්‍රසන්නව පිළිගෙන පවිටුවන් පිට මීට පෙර නුදුටු විරූ වරප්‍රසාද ධාරානිපාත වස්වා දුන් දෙවි ස්වාමීන් වහන්සේට මාගේ ජ්වලිත ස්තුතිය පිරිනැමීම යුතුකමකැයි හඟිමි. මේ ලියමන ගැන ඔබේ සතුටක් කර ගැනීමට ඔබට අවසර දෙමි." යනුයි.

රදගුරුතුමාණන්ගේ හසුනේ අවසාන භාගයේ කියන ලද ධර්ම වර්ධනය ගැන ගාර්සියා පියතුමාණෝ මෙසේ ලිවූහ. "රදගුරු තුමන් පැවැත් වූ ඥානකාන්ති දිනවල හෙලේනාගේ යාච්ඤාවේ හා ජ්වලිතකමේ බලය බෙහෙවින් හැඟී ගියේ ය. කම්මල සිටි මහා පාපිෂ්ඨයෝ ද, ගෝනවිල විසූ යකුන් වඳින්නෝ ද පාපොච්චාරණය කළෝ ය. ඔවුන්ගෙන් බොහෝ දෙනා හොඳ හිතින් ම පැමිණියහ." (දින පොත අප්‍රියෙල්, 22, 1872 : මැයි 4, 1872)

## පරීක්ෂණයෙන් පසු...

කුරුණෑගල සිට සිය ගමට පැමුණුණායින් පසුත්, පෙර සේම දුඃඛ ප්‍රාප්තිය සිදුවුණේ ය. "බ්‍රහස්පතින්දා එනම් දේවමාතා වහන්සේ පරලොවට වැඩිය මංගල්‍යය දින, සවස ගෞ. රූ, බූටැං සහ පෙරාර් නැමති පියවරු හෙලේනා දැකීමට ආවෝ ය. ඇගේ මුහුණ දිගේ ගලාගිය ලේ දහර දැක එතුමෝ පුදුම වූහ. එවිට හිසින් වෑහුණු ලේ නිසා ඇගේ වත මඬල අවලස්සන විය. සිකුරාදා දින ද, නැවතත් එතුමී කුරුසේ ඇණගැසී සිටීම දර්ශනය කිරීමට ගියෝ ය." (දින පොත අගෝස්තු 26, 1872) තවද පෙර සේම ජන සමූහයා ඇ දැකීමට පැමිණියාහ. ඇතැම් විට කලකෝලහාල ද ඇති විය. සතුරන් විසින් ඇයටත් ශුද්ධවූ සභා පාලකයින්ටත් කරදර පමුණුවන ලදී. තවද බොහෝ දෙනාගේ සම්භාවනයට ඇ ලක්වීමෙන්, ඇගේ ධර්මාභිවෘද්ධියට බාධාවක් සිදුවෙතැයි සැක සිතින් ගෞ. ගාර්සියා පියතුමාණෝ පෙළුනාහ. එබැවින් දුඃඛ ප්‍රාප්තියේ පිටස්තර ලකුණු

වලක්වන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලන මෙන් එතුමෝ හෙලේනාට අවවාද කළාහ. ඇගේ යාච්ඤාවට දෙවියන් වහන්සේගෙන් ලැබුණු පිළිතුරු නම් ඈ උන්වහන්සේගේ කැමැත්තට අවනතව ක්‍රියා කරන කල භයවීමට කාරණාවක් නැති බවත්, තව අවුරුදු දෙකකින් පිටස්තර ලකුණු නැතිවී යන බවත්ය. (දින පොත මැයි 4, 1872) 1874 මාර්තු මස 05 වන දින බ්‍රහස්පතින්දා ගෞ. ආන්ජෙලෝ, කර්දානෝ සහ පෙරාර් නැමති පියතුමෝ හෙලේනාගේ දුඃඛ ප්‍රාප්තිය දැකීමට පැමිණියෝ ය. එහෙත් එය සිදු නොවීය. ඒ ගැන පෙරාර් පියතුමන් ඇගෙන් ප්‍රශ්න කළ විට ඈ මෙසේ උත්තර දුන්නා ය. "වෙන විධියක් කිරීමට මම අපොහොසත් වෙමි. මා බිම හෙළන්නේත් බඳින්නේත් වධයට පමුණුවන්නේත් ජේසු ස්වාමි දරුවන්ගේ ශුද්ධවූ අභිප්‍රාය විසිනි. මෙදින එවැන්නක් සිදුවීම උන්වහන්සේගේ කැමැත්ත නොවේ. මේවා ගැන මට බලයක් නැත." යනුයි. (දින පොත මාර්තු 9, 1874)

දුඃඛ ප්‍රාප්තියේ පිටස්තර ලකුණු මෙවක් පටන් අතුරුදහන් වූ නමුත් අභ්‍යන්තර වේදනා තව බොහෝ කාලයක් පැවතින. දර්ශන හා දේව සාකච්ඡා ද විටින් විට සිදු විය. "ගිය සෙනසුරාදා ඈ පරවසම්ව සිටින විට දර්ශනයක් දිටි. ගින්නෙන් පිරුණු කුසලානක් ඇට පිළිගන්වා එය පානය  කරන්නට අණ කරන ලදී. ඈ ද මුළු හෘදයෙන් ජේසුතුමන්ට කැපවෙමින් එය අන්තිමය දක්වා පානය කළා ය. එතැන් පටන් ඈ ජ්වලිතයෙන් පිරී සිටී. පෙරට වඩා ඇය තුළ ශක්තියක් දැන් හැඟේ. මීට පෙර ජේසු ස්වාමිදරුවෝ ඈ දරුවකු සේ සැලකූ නමුත් මීට පසු උන්වහන්සේ ඇට එවැනි සැලකීමක් නොපෙන්වන සේක." (එම මැයි 2, 1874) "ඇගේ භයානක රෝගයට පසු පෙරටත් වඩා ඈ දර්ශන ලබන්නීය. ගිය සිකුරාදා ලෙයින් පිරුණු පාත්‍රයක් පානය කරන්නට ඇයට පිළිගන්වන ලදී. නැවතත් දුක් වේදනා පැමිණෙතැයි ඈ සිතන්නීය." (එම සැප්තැම්බර් 7, 1874)

## හෙලේනාගේ පියා

දෙවියන් වහන්සේ විසින් හෙලේනාට පෙන්වන ලද විශේෂ කරුණාව බොහෝ දෙනාගේ පැහැදීමටත්, සිත් හැරීමටත් හේතුවක් විය. ගම් වැස්සෝ වැරදි මත හැර දමා සත්‍යාගම වැළඳ ගත්තෝ ය. එහෙත් ඇගේ පියා පමණක් අන්‍යාගමික සිරිත් විරිත් අනුවම කල්

යවමින්, දෙවියන් වහන්සේ නොඅදහා යකුන්ටත්, දෙවි දේවතාවුන්ටත්, බලි බිලි පිදුවේ ය. මෙය හෙලේනාගේ කණගාටුවට බලවත් කරුණක් විය. ඇ විටින් විට ඔහු උදෙසා දෙවියන් වහන්සේට කන්නලව් කියා යාච්ඤා කළා ය. 1874 ශු. මරිය මදලේනා තුමිගේ මංගල්‍යයට පෙර දින, ඔහු ගැන ඇ භයානක දර්ශනයක් දිටී. " කාලවර්ණ ආවරණයකින් වසන ලද රථයක් පදවාගෙන යන කළු පාට මිනිසුන් කීප දෙනෙකු ඇට පෙනුණි. කොයිබට ද කියා ඇ ඔවුන්ගෙන් ඇසූ සඳ, ඇගේ පියාණන් රැගෙන යාටම පැමිණියේ යයි ඔවුහු පිළිතුරු දුන්නා ය. ඇ හඬමින් " ජේසුනී ඔහු වෙත අනුකම්පා වුව මැනව." කියා යාච්ඤා කළ විට රියකරුවෝ හැරී ගියෝ ය. එහෙත් එතුමී පියාගේ හිත හැරීම ජේසුතුමන්ගෙන් ඉල්ලූයෙන් " ඔබ අයදුම් පිළිගන්නට මා කැමති නමුත්, ඔහු මාගේ දයාව හෙළා දකින විට, කරුණාව පෙන්වන්නේ කොහොමද?"යි උන්වහන්සේ වදාළ සේක. මේ දර්ශනය නිසා ඇගේ හෘදය මහත් ශෝකයෙන් පිරී ගියේ ය. පියාගේ ආත්මය ගැන කඳුළු වගුරුවමින් ඇ දූන් හඬන්නීය. ජේසු ස්වාමිදරුවන් ඔහු නිසා වින්ද දුක් වේදනා කොපමණ මහත්දැයි නඩු තීන්දු දිනේ දී ඇට අවබෝධ වෙන බව දන්වන ලදී. උන්වහන්සේ ඇය වෙත ඇත්තා වූ ප්‍රේමය නිසා ඔහුට තද දඬුවම් නොදී ඉවසන සේක. (දින පොත ජූලි 22, 1874) මීට මාස කිහිපයකට පසු පරවසම්ව සිටින් දී ඇගේ පියාගේ ආත්මය උදෙසා යාච්ඤා කරන්නට ජේසු ස්වාමි දරුවෝ ඇට අණ කළා හ. (එම ඔක්තෝම්බර් 11, 1874 ) ඒ දේව අණට කීකරු වීමේ ප්‍රතිඵලය ගාර්සියා පියතුමා මෙසේ විස්තර කරයි." මෙපමණ අවුරුදු ගණනක් තුළ දී පුදන ලද යැදුම් නිසා මාගේ පෙම්වත් ජේසු ස්වාමීන් වහන්සේ හෙලේනා ස්වකීය පියාණන් උදෙසා කළ යාච්ඤාව පිළිගත්තේ යැයි මම සිතමි. ඔහුගේ දැඩි හිත වෙනස් කිරීමට උන්වහන්සේ විසින් තෝරා ගන්නා ලද උපක්‍රමය නම් උග්‍ර අසාධ්‍ය රෝගයකි. ඔහු ගිලන්වූ කාලයේ දී තම ආත්මය ගැන වචනයක්වත් මේ දූවගේ මුවෙන් පිටවෙනවාට විරුද්ධ වූයේ ය. ඔහු වාත රෝගයෙන් පෙළෙන කල උපස්ථානය පිළිගත්තේ අනිත් දූවරුන්ගෙන් පමණ ය. එහෙත් මා ඔහු වෙත පැමිණ පාපොච්චාරණය දුන් බවත්, ඔහු සුව කළ බවත් යනාදී ප්‍රවෘත්ති වර්ෂ 1880 දෙසැම්බර් මාසයේ දී ඔහු විටින් විට ස්වප්නයෙන් දුටුවේ ය."

"අන්තිමේ දී දේව වරප්‍රසාදය ඔහුගේ ආත්මය තුළ බලවත් ලෙස ක්‍රියා

කළෙන්, මා කැඳවා පාපක්ෂමාව ලබා ගන්නට ඉටා ගත්තේ ය. මම ද ඔහුගේ පාපොච්චාරණය අසා, රෝගය අසාධ්‍ය වූ බැවින් ඔහුට අන්තිම ආලේපය දුන්නෙමි. ඉන්පසු ඔහුට මදක් සුවය ලැබූ වහාම වේදනා නොබලා දිව්‍ය පූජාවට පැමිණියේ ය. මෙරටේ ඇතැම් පව්වුවන් මෙන් පල්ලියේ මිනී පිට්ටනිය ලබා ගන්නා අටියෙන් නොව, හරි හිතකින් ඔහු දෙවියන් වහන්සේ වෙත හැරී ආයේ ය. දැන් ඔහු තම දුව හෙලේනාගේ උපදෙස්වලට සතුටින් ඇහුම්න් දෙයි. ඈ කෙරෙහි මහත් විශ්වාසයක් තබයි." (එම ඔක්. 1881. 408 - 10 පිටු) "වර්ෂ 1884 අගෝස්තු මස 10 වන දින පස්වරු හතට හෙලේනාගේ පියා කාලක්‍රියා කළේ ය. ඊට අට දිනකට පෙර ඔහු අන්තිම ආලේපය ද මාර්ගෝපකරණ වශයෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ද, ලබා ගත්තේ ය. අන්තිම හුස්ම හෙළන තෙක් විටින් විට ජේසු ස්වාමිදරුවන්ගේ සුමිහිර පරිශුද්ධ නාමය උච්චාරණය කළේ ය. ඔහුගේ මරණය ආදර්ශවත් එකකි. මෙලෙස තම පියා ගැන හෙලේනාගේ පැතුම් සියල්ලම ඉටු විය. දැන් ජේසු තුමන් වෙත ඇගේ ශ්‍රද්ධාවත් ප්‍රේමයත් ස්ථිර වී ඇත. තම පියාට දුන් මේ උත්තම වරප්‍රසාදය නිසා උන්වහන්සේට කුමන තිළිණයක් පුදන්නට දැයි ඈ ළත වන්නී ය. ඔහුගේ මරණින් පසුව දා මම ඔහුගේ මළ සිරුරට ආශිර්වාද කරමින් සොහොන් භූමිය කරා ද ගියෙමි." ඔක්. 1884, 431 - 2 පිටු)

## ධර්මගුණ ලක්ෂණ

දෙවියන් වහන්සේ අප මැවූ සේක. එබැවින් අප ආත්මයත්, ශරීරයත්, ඥාන ශක්තියත්, අධිෂ්ඨාන බලයත්, දේහ ලක්ෂණ හා ඉන්ද්‍රියන්ගේ වැර වෑයමත් සමගම අපි මුළුමනින් ම උන්වහන්සේටම අයිති වෙමු. අප පැවැත්ම උන්වහන්සේගෙන් සැලසුනාක් මෙන්ම, අප අන්තිම සන්තර්පණය ද, උන්වහන්සේ වෙත විය යුතුය. මැවුම්කාරයාණන්ගෙන් තොරව මැවිල්ලක වැදගැම්මකුත් නැත. අර්ථයකුත් නැත. අප්‍රාණික සප්‍රාණික සෑම වස්තූන් උන්වහන්සේගේ උතුම් මහිමය තම තමන්ගේ ස්වභාවයන් පරිදි ප්‍රකාශ කරන්නාහ. මනුෂ්‍යා නැණවත් සත්වයකු බැවින්. දෙවියන් වහන්සේ දැන ඇඳිනගෙන, ස්වකීය නිදහස් කැමැත්තෙන්ම උන්වහන්සේ වෙත ඇලුම්ව සිටිය යුතුය. "තමගේ ස්වාමී වූ දෙවියන් වහන්සේට තමගේ මුළු සිතින් ද, තමගේ මුළු ආත්මයෙන් ද, තමගේ මුළු ශක්තියෙන් ද, ප්‍රේම

කරව" යි මනුෂ්‍යාට දෙවියන් වහන්සේ අණ කළ සේක. (ද්වි. නීති 6.4) උන්වහන්සේට අප මුළු හෘදයෙන් ප්‍රේම කිරීම අපගේ ප්‍රධාන කටයුත්ත වේ. ප්‍රේමය වනාහි සාංයෝගික ශක්තියයි. පෙමින් වසන්නන් අතරේ සමගියක් ඇත. එක්සිත් කමත් එක්සත්කමත් පවත්නේ ය. දේව ප්‍රේමයෙන් වසන්නෝ දෙවියන් වහන්සේ තුළ වාසය කරන්නාහ. දෙවියන් වහන්සේ ද ඔවුන් තුළ වාසය කරන සේක." (1ජුවන් 4.16) මේ සමගිය පටන් ගන්නේ ඉෂ්ට වරප්‍රසාදය පළමුවරට අප ආත්මයෙහි පතිත වන දින හෙවත් ප්‍රසාද ස්නාපනය ලබන දින දී ය. එදින ආත්මය තුළ සිදුවන විපර්යාසය විස්මයජනකයි. අප ඥානයට සහ කැමැත්තටත් අමුතු ශක්තියත් ලැබීමෙන් දෙවියන් වහන්සේ විසින් ප්‍රකාශිත සත්‍යයන් නිසි ලෙස දැනගෙන ඒවා විශ්වාස කරන්නටත්, උන්වහන්සේ අපගේ එකම සම්පත්තිය බව අදහාගෙන උන්වහන්සේට ප්‍රේම කරන්නටත් අපට හැකි වන්නේ ය. තවද, මනුෂ්‍ය පුත්‍රයන් වූ අපි ඉෂ්ට වරප්‍රසාද නිසා දෙවියන්ගේ දරුවන් වීමෙන්, මෝක්ෂ රාජ්‍යයට හිමිකාරයෝ ද වෙමු. ඉෂ්ට වරප්‍රසාද අප තුළ ඇතිතාක් අපගේ සෑම යහපත් ක්‍රියාවෝ දෙවියන් වහන්සේට ප්‍රසන්න වූ ද මෝක්ෂ මහිමය වැඩි කරන්නා වූ ද පින් කුසල් වෙත්. මේ දේව දාරක ලක්ෂණය මරණීය පාපය නිසා අභාවයට පැමිණේ. ස්වල්ප පාපය නිසා එය අඩපන වී යන්නේ ය. එහෙත් පාපොච්චාරණය මගින් නැතිවූ ආත්මික ජීවිතය නැවත ලබාගන්නටත්, අඩු වූ අලංකාරය හා හීන වූ ශක්තිය ද අලුත් කර ගන්නටත් අපට පුළුවන.

ඉෂ්ට වරප්‍රසාදය අඩු වැඩි වන ප්‍රමාණයට දේව ප්‍රේමය ද අඩු වැඩි වන්නේ ය. තවද මේ අභිනව ස්වභාවය අනුව කෙරෙන ක්‍රියා හේතුකොට ගෙන ඒ ස්වභාවයේ ශක්තිය ද වර්ධනය වේ. එය වැඩිවන පමණට ආත්මයේ වැර වෑයමත් දියුණු තියුණු වන්නේමය. ඒ සමගම විශ්වාසය, බලාපොරොත්තුව, දේව ප්‍රේමය සහ අනිත් ලෝකෝත්තර ධර්ම ගුණයෝ ද වේගයෙන් ක්‍රියා කරත්. ස්ප්‍රිතුසාන්තු වහන්සේ එවැනි ආත්මයක් වෙත කරුණා බැල්ම වදාරමින්, උන්වහන්සේගේ සප්ත දීමනාවන්ගෙන් එය වඩාත් අලංකාර කරන සේක.

මෙලෙස ප්‍රසාද ස්නාපනය ලබන දින ක්‍රිස්තියානි ආත්මයේ දල්වන ලද දහම් ගිනි පුපුර, වැඩිවෙමින්, දැඩිවෙමින්, එහි ඇසිරී ඉසිරී ආත්මයේ ශක්තීන් තුළ නව ජීවනයක් උපදවා, ඉන්ද්‍රීන් පවා අභිභවනය කරගෙන මහා තාපයක් මෙන් වොරැදේ. දේව ප්‍රේමාග්නියෙන් දැවෙන

ආත්මය දෙවියන් වහන්සේ සමග කොතරම් ඒකාබද්ධ වන්නේ ද කිවහොත්, උන්වහන්සේ හැර වෙන යමක් මෙලොවෙහි පවා ඔහුට නොපෙනේ. සකල වස්තූන් හා තමා ද, අවිද්‍යමානව දෙවියන් වහන්සේ පමණක් ඔහුට ප්‍රත්‍යක්‍ෂ වන සේක. එවිට ශුද්ධවූ පාවුලුතුමන්ට මෙන් ඔහුට ද කිව හැක, "මම ජීවත් වෙමි. එහෙත් දැන් මා නොවේ. ක්‍රිස්තු ස්වාමිදරුවෝ මා තුළ ජීවත් වන සේක. " (ගලාති 11:2) "මාගේ ස්වාමිනී, මාගේ සියල්ලෙනි." (ශු. ප්‍රැන්සිස්කු අසීසි)

හෙලේනාගේ චරිතයේ ප්‍රකාශවෙන ඇතැම් ධර්මගුණ ගැන අපි කල්පනාකර බලමු. බොහෝ දෙන ඈ පිළිබඳ ලියා කියා තිබෙන "පුදුම" දේවල් ගැන පමණක් සිතති. මේවා දෙවියන් වහන්සේගෙන් ලැබෙන විශේෂ කරුණා ප්‍රසාද විය. මේ පෞද්ගලික ධර්මිෂ්ඨභාවයක ඒකාන්ත ලක්‍ෂණයෝ නොවෙත්. ජුදාස් ඉස්කාරියොත් අනිත් අපෝස්තුලුවරුන් මෙන් යකුන් පළවා හැර, රෝග සුව කරමින් පුදුම කරන්නට ඇත. එහෙත් එයින් ඔහු ධර්මිෂ්ඨයෙක් නොවීය. බොහෝ ශුද්ධවරයෝ මෙලොවෙහි පුදුම නොකළෝ ය. උන්වහන්සේලාගේ මෙලෝ ජීවිත ගැන පුදුම යමක් සඳහන් කර නැත. උන්වහන්සේලා මිහිපිට ගත කළ ජීවිත ගුප්ත සැඟවුණු වු ද, උන්වහන්සේලාගේ චරිත උත්තම ධර්ම ගුණයන්ගෙන් පරිපූර්ණ වූයේ ය. හෙලේනාගේ ධර්මගුණ ලක්‍ෂණයන් අතරෙන් පළමු කොට ඉදිරිපත් වන්නේ ඇගේ **විශ්වාසයයි.** බාල කාලයේ දී ආගමේ සත්‍යයන් ඉගෙන ගැනීමට ඉඩ ප්‍රස්තාවක් නොතිබුණ නිසා විශ්වාසය අතින් එවකට ඇතැම් අඩු පාඩු සිදුවිය. එහෙත් ආගම ධර්මය හොඳාකාරව දැනගත්වහාම, විශ්වාසය ඇගේ චරිතයෙහි ස්ථිර බලයක් විය. දිව්‍ය පූජාව ඇසීම ගැන ද, දිව්‍ය සත්ප්‍රසාදය ගැන ද, ඈ තුළ දැල්වුණා වූ භක්තියට ප්‍රධාන හේතුව වූයේ ඇගේ ප්‍රාණවත් විශ්වාසයයි. සත්ප්‍රසාදයෙහි සැඟ වී සිටි සවාමිදරුවන් ඇගේ මසැසින් දුටුවාක් මෙන් ක්‍රියා කළා ය. එබැවින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත් දිනවල ඇගේ හද තුළ පෙම් ගින්නක් ඇයට හැඟිනි. හැමතැනම පිරී වැඩ සිටින දෙවි මහෝත්තමයාණන් වෙත දැක් වූ ශ්‍රද්ධාවේ ප්‍රතිඵලයක් වශයෙන් ශුද්ධවූ ත්‍රිත්වයේ හා ජේසුතුමන්ගේ අභිමුඛයෙහි ඈ නිතොර හැසිරුණා ය. මේ පිළිබඳව ගාර්සියා පිතුමා මෙසේ කියයි. "දේව සමගිය ඈ කදිම ලෙස දැන් භුක්ති විඳින්නී ය. ශුද්ධවූ ත්‍රිත්වය ඇගෙන් කවදාවත් ඈත්ව නොවන බව ඈට දැනේයයි මට කීවා ය. ජේසු ස්වාමිදරුවන්ගේ කරුණාව ගැන උන්වහන්සේට නිසි ලෙස තුතිපිදීමට තමන්ට කවදාවත් හැකි නොවේයැයි සිතමින් ඈ

කනස්සලු වන්නී ය." දින පො. ඔක්. 2, 1871)

ඇගේ දෘඪතර විශ්වාසය නිසාම තම පියාගේ ද දෙටු සොහොයුරාගේ ද අනවිනකම් හා වෙනත් වැරදි ක්‍රියා ගැන ඕ දුකින් තැවුණා ය. ඔවුන් එයින් වැළැක්වීමට දැඩි වෑයමක් දැරුවා ය. ඒ නිසා ඔවුන්ගෙන් කම්කටුලු හා වද වේදනා වින්දාය. ස්වකීය ආත්මික පියාණන්ට ද, රදගුරුතුමන්ට ද, දැක් වූ අවනත කීකරුකම හා ශුද්ධවූ සභාවේ පූජාප්‍රසාදීන් වහන්සේලා වෙත පෙන්වූ ගෞරවය ද ඇගේ විශ්වාසයත් ශ්‍රද්ධාවත් පිටම රඳා තිබුණේ ය. ශුද්ධෝත්තම පියතුමන්ගේ නිදහස හා සෞභාග්‍යය ගැනත්, ශුද්ධවූ සභාවේ කීර්තිය ගැනත් ඇගේ සිත පෙළූ - සංවේගය සහ ඒ අදහස් අනුව ඈ ඔප්පු කළ යාච්ඤා හා දුක් වේදනා මේ විශ්වාසය කරණකොටගෙනම ය. ඈ පිළිබඳ දෙවියන් වහන්සේ පෙන්වූ පුදුම පුවත් ප්‍රකාශ වූ විට ඇතැම්හු ඇට හිරිහැර කළහ. සරදම් කළහ. ඈ ගැන පිළිකුල් දුසා වචන දෙඩූහ. එහෙත් ඒවා සියල්ලම ඕ විශ්වාසය නිසා සුබ සිතින් ඉවසා ගත්තා ය.

ලෝක ශාස්ත්‍රය පිළිබඳ ඇට උගත්කමක් නොතිබිණ. එහෙත් දෙවියන් වහන්සේ ගැන ඇට තිබුණ පැහැදීම පුදුමයට කාරණාවක් විය. "දූන් ඇයගේ ධර්ම ඵල අනුන්ටත් බෙදා දෙන්නී ය. ඇගේ ශිෂ්‍යයෝ ඇගේ සිද්ධිය නොදනිතත්, ඈ කෙරෙහි අධික ගෞරවයකින් බැඳී ඇගේ උපදේශයට භක්තියෙන් ඇහුම්කන් දෙන්නාහ. ඇගෙන් උපදෙස් ලැබ සාධාරණ පාපොච්චාරණයක් කරන්නට සූදානම් වූ පාපිෂ්ඨයෙක් මා වෙත වරක් පැමිණියේ ය. ඔහුට ඒ ගැන තිබුණ අවබෝධය කොතරම් ද කිවහොත් මගේ උපදේස්වලින්වත් එවැනි පැහැදීමක් ඔහුට ඇති වේ යැයි නොසිතමි." (දින පොත අප්‍රියෙල් 30, 1871) "අනුන්ට උගන්වන කල අමුතු ඥානාලෝකයක් ලැබෙන බව ඇට හැඟේ... සැබවින්ම අනුන්ට උගැන්වීමට ඇට කදිම බලයක් ඇතැයි පෙනී යයි. ඇගේ වචන ඇසීමෙන් බොහෝ දෙනා ප්‍රයෝජනය ලබත්." (එම නොවැම්, 10, 1874) වර්ෂ 1878 ජනවාරි මාසයේ දී හෙලේනා යම්කිසි උවමනාවක් සඳහා කොළඹ කන්‍යාරාමයකට ගියාය ය. බොහෝ දෙනෙක් ඈ දකින්නටත් ඈ සමග කතා කරන්නටත් පැමිණියහ. කිහිප දෙනෙක්ම ඇගේ භක්තිමත් වචන අසා ඇගෙන් ඉවත්ව නොගොස්, ධර්ම මාර්ගය හා ආත්මික ජීවිතය ගැන කරුණු හැකිතාක් ඇගෙන්ම ඉගෙන ගැනීමට ආශා වූහ. (එම ජනවාරි 7, 1878)

ඇට විශේෂ පැහැදීමක් තිබුණේ වේද සත්‍යයන් ගැන පමණක් නොව, ඇතැම් විට තමාගේ සහ තම සහචරියන්ගේ ආත්මික තත්ත්වය ගැන කරුණු ද දේව වරමින් දැන සිටියා ය. ඇ සිටි ආරාමයේ එක්තරා කූට තාපසිකාවක් බොරු දර්ශන ප්‍රකාශ කරමින් තම ආත්මික පියාණන් නොමග හරින්නට තැත් කළා ය. මේ තැනැත්තියගේ ක්‍රියා කලාපයේ ඉෂ්ටානිෂ්ට දිව්‍ය ඥානයෙන් දැනගත් හෙලේනා එම කරුණු උන්වහන්සේට දැන්වූවා ය. මේවා පිළිබඳ ගාර්සියා පියතුමා මෙලෙස ලියයි. "ශුද්ධවූ ත්‍රිත්වය හා සමගිය ඇ කදිම ලෙස භුක්ති විඳින්නී ය. ඇගේ ධර්ම සම්පූර්ණකම ගැන හා ඇට මත්තට පැමිණෙන්නට යන පීඩා ගැනත් "ජී......" නැමැත්තිය ගැනත් කාරණා කදිම ලෙස දැන සිටී. "ජී" නැමැත්තියගේ ආත්මික තත්ත්වය වෙන විධියකින් නොව, දේව වරමින්ම ඇ දැනගත් බව මට නිසැක ය. " (එම නොවැම්. 26, 1871)*

දේව ප්‍රේමය හෙලේනාගේ ආත්මය තුළ මහා ගින්නක් මෙන් ඇවුළුණෙන් ලෝකාශා, කාම කෙලේශයන්, අයුතු ඇල්ම ගති, උඩඟුව යනාදි පාප දෝෂ මේ ගිනි දැල්ලෙහි දැවී භෂ්ම විය. එවිට ඇගේ පිරිසිදු ආත්මය අතරේ ද දෙවියන් වහන්සේ අතරේ ද, සමගිය දියුණු වුණි. උන්වහන්සේ වෙත ඇගේ ආත්මය ඇදී ගියේ ය. ඇගේ කල්පනා ද, ආශා ද, නිතැතින්ම උන්වහන්සේ වෙතම යොමු විය. දේවාභිමුඛයෙහි වාසය කිරීමත්, ජේසුතුමන් සමග ප්‍රිය සම්භාෂණයෙහි යෙදී සිටීමත් ස්ථිර පුරුද්දක් විය. ඇගේ ආත්මික තත්ත්වය දැන සිටිය ගාර්සියා පියතුමාණෝ අපට මේ කරුණු මදක්වත් කියා දෙත්වා. "හෙලේනා කදිම ලෙස ජේසු ස්වාමිදරුවන්ගේ මිත්‍රකම භුක්ති විඳින්නී ය. (එම අගෝස්තු 26, 1870) "ජේසු ස්වාමිදරුවන් ඇ වෙත පෙන්වන කරුණු පුදුමාකාරයි. මා අද ඇ සමග සාකච්ඡාවෙන් පැය දෙකක් පමණ ගත කළ නමුත්, විනාඩි පහක් පමණවත් දැනුනේ නැත. ජේසු ස්වාමිදරුවෝ ඇට සෑම දේම කියා දෙන සේක." (එම ජනවාරි 1871, පිට 174) "මීට පසු ඇ ජේසු ස්වාමි දරුවන්ගේ වැඩපල ගැන සැලකිය යුතු බවත්, උන්වහන්සේ ඇ ගැන සලකන බවත්, ඇට දන්වා වදාළ සේක. එවක් පටන්, ඇ පිටස්තර යම් වැඩක් කරන විට ද තම හෘදය තුළ ජේසු ස්වාමිදරුවන් වැඩ වසන බව ඇට පෙනෙන්නෙයැයි ඇ මට කීවා ය. මේ උත්තම වරප්‍රසාදය ගැන ඇ බොහෝ පුදුම වන්නී ය. " (එම

---

* "ජී" නැමති අකුර ඒ කූට තාපසිකාවගේ නාමයේ මුල් අකුරයි.

නොවැම්බර් 1871, පිට 246) "දැන් ඇගේ පැවැත්මක් නොමැත්තෙයයි ඈ මට කියයි. "දෙවියෝ පමණකි....." ඈ ජේසු ස්වාමි දරුවන් ඉදිරියෙහි වාසය කරන බවත්, උන්වහන්සේ ඇට උගන්වන බවත් සැක කිරීමට ඇට නුපුළුවන. " (එම අප්‍රියෙල් 23, 1871)

එහෙත් හෙලේනාගේ ජීවිතය සැනසීමෙන් පිරුණු කරදරවලින් විරහිත කාල පරිච්ඡේදයක් බව නොසිතන්න. රන් කරුවා රන් කැටය උදුනේ ලා ගින්නෙන් සෝදිසි කරන්නාක් මෙන්, දෙවියන් වහන්සේ තම ශුද්ධවරයන් පරීක්ෂා කරන සේක. ( ඥාන xii 13) ගහක සවිය දැන ගන්නට ලැබෙන්නේ සැඩ සුළඟ හමන විට ය. ප්‍රේමයේ ඉෂ්ටානිෂ්ටය ප්‍රත්‍යක්ෂ වෙන්නේ උපද්‍රා මධ්‍යයේහි ය. හෙලේනාගේ ශාරීරික වේදනා මීට පෙර විස්තර කළෙන්, ඇගේ චිත්ත පීඩා සැකෙවින් වත් මෙතන දී සඳහන් කළ යුතුයි. දෙවියන් වහන්සේට ප්‍රේම කරන ආත්මයක ආලෝකයත් ප්‍රීතියත් දිව්‍යාභිමුඛය වේ. එබැවින් එයින් වියෝවීම එවැනි ආත්මයකට පැමිණිය හැකි උග්‍ර උපද්‍රවයකි. ඇතැම් විට දෙවියන් වහන්සේ තම ශුද්ධවරයන්ගේ ගති ගුණ හා ප්‍රේමයේ ස්ථිරතාවය ද විමසා බලනු වස් ඔවුන්ගෙන් ඈත්වන සේක. එකල ආත්මය අඳුරින් පිරී යන්නේ ය. අහසත් පොළොවත් තමන් පෙළන්නට කැරලි ගැසී සිටින්නා සේ ඔහුට පෙනෙන්නේ ය.

හෙලේනාගේ චරිතයෙහි ද මෙවැනි අවස්ථාවන් ඇති විය. ගාර්සියා පියතුමාණන්ගේ වචන මෙහි බහාලමු. "මේ අසරණ ළඳ දැන් මහා ආත්මික අන්ධකාරයෙහි ගිලී නපුරු පරීක්ෂාවලින් මඩන ලදුව දුක් විඳින්නී ය. ඇගේ සිත වෙන අතට යොමු කළ නිසා ජේසු ස්වාමිදරුවෝ ස්වකීය ආශ්‍රයෙන් ඈ ඉවත් කළ බව ඇට රෞද්‍ර ලෙස කී සේක. දැන් ඈ යක්ෂයා අතට අසු වී සිටින බව ඇට හැඟේ. දෙවියන් වහන්සේ ඇට සරණ වෙමින්, මේ මහත් භයානක උපායට අසු නොවන සැටියට ඈ ආරක්ෂා කරන සේක්වා." (එම ජනවාරි 1871, පිට 193) "මීට දින ස්වල්පයකට පෙර සේම, ඈ තවම අඳුරෙහි සිටියි. අහස් නැඟීමේ මංගල්‍යය දින පරවසම් වීම් ආදිය නැවතුනෙන් අන්ධකාරයෙහි ද භයානක පරීක්ෂා මධ්‍යයෙහි ද වසන්නී ය. එහෙත් යම් අමුත්තෙකු ඈ දැකීමට පැමුණුනොත්, ඔහු සතුටු කිරීමට සුබ වචන නිතොර ඇගේ මුවෙන් පිට වේ. මෙය වැළැක්වීමට යක්ෂයා දරූ අධික උත්සාහය නිශ්ඵල විය." (එම මැයි 1872, පිට 279)

ඇතැම් විට ඇගේ ආත්මික ශුද්ධිය ගැන ද ඇට ලැබුණු විශේෂ වරප්‍රසාද ගැන ද බලවත් සංකා සිය හද තුළ ඇති වූයෙන් බොහෝ පීඩා වින්දා ය. අපාගත සතුරා ද ඇට නොයෙක් අන්දමින් හිංසා කළේ ය. ඇට බොරු දර්ශන පෙන්වා ඇ මංමුළා කරන්නට තැත් කළේ ය. "ඥානෝක්කාන්ති දිනවල දී හෙලේනාගෙන් සිදු වූ යහපත ගැන යක්ෂයා කෝපවෙමින්.... ඇට උග්‍ර පීඩාවක් පැමුණුවේ ය. ඇගේ දුඃඛ ප්‍රාප්තිය, පරවසම් වීම් යනාදිය ඇගේ කූට උපායක් බව ද, ඇ මාවත් රාජගුරුතුමන්වත් රවටා, ශුද්ධවූ සභාවට නිගා කළ බව ද, ඇගේ ක්‍රියා සියල්ලම යක්ෂ මායමින් කළ බව ද ඔහු ඇට පෙන්වා දුන්නේ ය. ඥානෝක්කාන්තිය අවසාන වූ දිනම ඇ ශෝකයෙන් හඬමින්, ඇ අනුන් රැවටූ නිසා ඇගේ අපරාධය සැමතැනම ප්‍රකාශ කළ යුතු බව මටත් ක්‍රිස්තිනාටත් දන්වා සිටියා ය." (එම මාර්තු 1874, පිට 325) තවද විශ්වාසය, බලාපොරොත්තුව, දේව ප්‍රේමය නැමති ධර්ම ගුණයන්ට විරුද්ධ වූ පරීක්ෂා ඇගේ හිතත් හදත් පෙළුවේ ය. (එම මාර්තු 1871, පිට 196) "මෙ කල යක්ෂයා හෙලේනාට දර්ශනයක් පෙන්වා පරීක්ෂා කළේ ය. ඔහු ජේසු ස්වාමිදරුවන්ගේ ද උන්වහන්සේගේ මෑණියන්ගේ ද වෙස් පාමින්, රැකවල් දේවදූතයකුගේ රූපය ගත් අවතාරයක් ද, කැටුව ඇට දර්ශනය විය. ඇ රැක බලාගැනීමට දූත අවතාරයට නියම කරමින්, නොයෙක් දේවල් දෙඩුවේ ය. ඔහුගේ ප්‍රයෝගය වහාම දැනගත් හෙලේනා, ඔහුට පලායන්නට අණ කළා ය. එවිට යක්ෂයා බේරෙන්නට මාරුවක් නැති බව තේරුම් ගෙන ඔහුගේ හරි වෙස් හෙවත් භයානක සතුරකුගේ විලාශය දක්වමින් අතුරුදහන් වූයේ ය." (එම නොවැම්. 20, 1871)

එහෙත් මෙම උවදුරු මැද ඇගේ හද තුළ මහත් ශාන්තියක් පැවතුණේ ය. එයින් හටගත් ප්‍රීතිය හෘදයෙන් ඉපිල ගොස් ඇගේ වත මඬලෙහි ද ප්‍රකාශ විය. "ඇගේ මුහුණෙහි නිතරම සුරදූතික ප්‍රමෝදයක් බැබළෙන්නේ ය"යි ගාර්සියා පියතුමාණෝ කියති. (එම නොවැම්බර් 26, 1872) දෙවියන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් ලැබුණු දුකත් සැපත් ඇගේ ප්‍රීතිය විය. එමෙන්ම ඇගේ බැහැපත් කමට කාරණා විය. "බර වූ කුරුස (හෙවත් පීඩා) ඉසිලීමට ඇ ආශාවෙන් සිටී. එයින් මිදීමට ඇ භය වේ යැයි මට කියයි. ඒ මන්ද කිවහොත් ජේසු ස්වාමි දරුවන් ඇට මහත් ආදරයක් පෙන්වන නිසාත්, උන්වහන්සේ නිතර ඇට මිහිරි වදනින් ද දිව්‍ය මාර්ගවලින් ද, උගන්වන නිසාත් ය. ඇට දෙවියන් වහන්සේ වරම් දෙවා වදාරන ප්‍රමාණයට ඇගේ බැහැපත්කමත් වැඩි වන්නේ ය. ඇගේ

වචනයට ඇහුම්කන් දීමෙන් මම ද බොහෝ සැනසීම් ලබන්නෙමි. ඇත්තෙන් ම එතුමී ජේසු ස්වාමිදරුවන් විසින් තෝරා ගන්නා ලද්දියකි." (එම පිට 230)

## වරායට පැමිණීම

පෙර කී පරිදි 1874 න් පසු දුඃඛ ප්‍රාප්තියේ පිටස්තර ලකුණු, සිදු නොවී ය. එහෙත් ඇතුළාන්ත වේදනා පැවතින. කල් යත් යත් ඈ දැකීමට පැමිණි පිරිස ද, ඈ පිළිබඳ ඇති වූ කැළඹිලි ද තුනී වී ගියේ ය. එවක් පටන් ඇගේ පිටස්තර ජීවිතය රැළ පතර නැති නිසල ගැඹුරු ජලාශයකට සමාන විය. ගාර්සියා පියතුමන් ස්ථාපිත පැවදි පංතියේ තාපසිකාවෝ එකල ළමයින්ට අකුරු හා උපදේශ හැදෑරවීමේත් අභිනව ක්‍රිස්තු භක්තිකයන්ට ආගම උගැන්වීමේත් කටයුතුවල යෙදී සිටිය බැවින් හෙලේනා ද ඒවා ගැන වෙහෙස මහන්සි වූවා ය. එහෙත් හැකි පමණ කාලයක් යාච්ඤාව සහ භාවනාව සඳහා ගත කළා ය. "දැන් ඈ පාසලේ ගැහැනු ළමයින් විභාගයට සූදානම් කිරීමට බොහෝ කරදර විඳියි. වරින් වර පරවසම්ව ශුධිකාග්නිස්ථානයේ ආත්මයන් ගැන දර්ශන ලබන්නී ය. වරක් ඈ එතැනට ගෙනයන ලදුව බොහෝ දුක් වින්දා ය. ඉන්පසුව ඒ ආත්මයන් වෙත මහත් අනුකම්පාවක් උපදවාගෙන, දිව්‍ය පූජා සිද්ධකරනු වස් මුදල් ටිකක් එකතු කරන්නට උත්සාහ දැරුවා ය." (එම මැයි 1877 පිට 388) ගාර්සියා පියතුමාගේ දින පොතෙහි 1888 දක්වාම ඇගේ ධර්ම සංවර්ධනය ගැන කරුණු තැනින් තැන සඳහන් වී ඇත. (පිටු. 421, 424, 442: දෙසැම්බර් 1888)

වර්ෂ 1881 අගෝස්තු මාසයේ දී රදගුරුතුමාණෝ බෝලවත්තට පැමිණි කල හෙලේනාට විශේෂ කරුණාව පෙන්වමින් ඇගේ ද ඇගේ සහචරියන්ගේ ද ශුභසිද්ධිය ආරක්ෂා කරන්නට ගාර්සියා පියතුමන්ට පොරොන්දු වූහ. (එම පිට 418) එය වයස්ගත අප පියතුමන්ගේ සිතට මහත් සහනයක් ගෙන දුනි. 1889 මාර්තු 31 වන දින එතුමා පූජාත්වරය ලැබ පනස්වන සංවත්සරය හෙවත් රන් ජුබිලිය, මීසමේ සැමතැනම ගරුගාම්භීරයෙන් පවත්වන ලදී. 1900 මාර්තු මස 25 වන දින ශුද්ධවන්ත ලීලාවෙන් එතුමාණෝ කාලක්‍රියා කළාහ. ශ්‍රද්ධාසාර ජන සමූහයා එතුමන්ගේ මෘත දේහය ගෞරවයෙන් බෝලවත්ත දේවස්ථානයේ මිහිදන් කළහ.

## අවසාන කාලය

ඇගේ බාලවියේ සිට ඈට ධර්ම මාර්ගය පෙන්වමින්, අන්තරා සමුද්‍ර පසුකරවා ගෙන සුබ පැතුම් වරායට ඇගේ ආත්මය පැමිණෙවූ උත්තම ගුරුතුමාණන්ගේ මරණය ඈට කිව නොහැකි පාඩුවක් විය. උන්වහන්සේගෙන් පසු බෝලවත්ත මීසමට පැමිණි පූජාප්‍රසාදීන් වහන්සේලා, එතුමීට කරුණාව ද සැලකීම ද පෙන්වූ නමුත්, ඈට සිදු වූ අඩුපාඩුව මරණය තෙක් පිරිමැසුණේ නැත. එහෙත් ඇයගේ ධර්ම මෙහෙය පෙර සේම හිත ඇතුව පැවැත්වූවා ය. ළමයින්ට උගැන්වීම හැර මීසමේත් අවට ගම්වලත් මීසදිටුවන්ට ආගම ගැන කියාදෙමින්, ඔවුන් ශුද්ධවූ සභාවට ඇතුලු කරගත්තා ය. පාප මාර්ගයන්හි හැසුරුණු යම් ක්‍රිස්තු භක්තිකයකු දුටු විට ඔහුට කරුණාවෙන් කතා කරමින් ධර්ම මාර්ගයට හරවා ගත්තා ය. මීසමේ යහපත් සමිති සමාගම් නිසිලෙස ගෙන යාමට ඈ සර්වප්‍රකාරයෙන් ම පූජාප්‍රසාදීන් වහන්සේලාට ආධාර කළා ය. ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී වත මණ්ඩලය භක්තිය ඇගේ උත්සාහය නිසාම ගෝනාවිල දේවස්ථානයේ පිහිටුවන ලදී. එය අද දක්වාම නොකඩවා පවතී. ඇගේ මරණය තෙක් ලංකාවේ සතර දිගින් පැවිදිවරුන් හා නොයෙක් තරාතිරම්වල සැදැහැවත්හු ද ඇගේ යාච්ඤා පිහිට ඉල්ලනු වස් ඈ සොයා පැමිණියා හ. බොහෝ දෙනාගේ සම්භාවනයට හිමිකාරියක් වුව ද, බැහැපත්කමින් ජීවිත ගත කළා ය. දෙවියන් වහන්සේ ඈට දානය කළ අනගි වරම් ගැන වචන මාත්‍රයකුදු මුවෙන් පිටවුණේ නැත. ඒවා මඳක්වත් සිහිපත් කර දුන් අත් පාවල කැළැල් පවා සඟවා ගන්නට නිතොරම ඕ තැත් කළා ය.

## මරණය

හෙලේනා වර්ෂ 82ක් ආයු වළඳා, පින් කුසලින් පිරි, ධර්මධර චරිතයක අලංකාරය බබළවමින් වර්ෂ 1931 පෙබරවාරි මස 8 වන දින ගෝනාවිල දී කාලක්‍රියා කළා ය. ඇගේ අන්තිම මොහොතේ දී ඈට ආත්මික උපස්ථානය කළේ අප රට ධර්මදූතයන් අතරෙන් වයසින් ද සේවයෙන් ද මුදුන් මල්කඩ වූ ගෞ. බුලික් පියතුමා ය. ඇගේ මරණය ගැන ආරංචිය පැතිර ගිය විට, සෑම අතින්ම ජන සමූහයා පැමිණ, ශුද්ධවූ ශරීරයකට පෙන්වන ගරු සම්මානය ඇගේ මෘත කලේබරයට පෙන්නූහ. අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ අවසරය පිට මෘත දේහය

ගෝනාවිල දේවස්ථානයේ මුළු දිනයක්ම සයනාසනය මත වඩවා තබා දහවන දින දිව්‍ය පූජාවෙන් පසු ගිහි පැවිදි මහා පිරිසක් එය ගෞරවයෙන් ඔසවාගෙන ගොස් ගෝනාවිල මිනී පිට්ටනියේ මිහිදන් කළා හ. ඇගේ මෘත ශරීරය කෙසේ වෙතත් ඇගේ කීර්ති දේහය අද දක්වාම අජරාමරව පවතී. දේව අදහස් අපි නොදනිමු. එහෙත් දිව්‍ය කුමාරයාණන්ගේ දාසී වන හෙලේනාගේ කීර්තිය පිළිබඳ යම් වන්දනීය දේවාභිප්‍රායක් වේද එයම සිදුවේවායි බැති සිතින් ප්‍රාර්ථනා කරම්හ.

"සහෝදරවරුනි, මා ඔබ වෙත පැමිණි කල්හි ක්‍රිස්තු ස්වාමිදරුවන්ගේ ප්‍රකාශය ඔබට එළිදරව් කළේ උදාර වචනයෙන් හා පණ්ඩිතකමින් නොවේ. මක්නිසාද යත්, ජේසු ක්‍රිස්තු ස්වාමින් වහන්සේත් උන්වහන්සේ කුරුසේ ඇණගසනු ලැබූ බවත්, මිස අන් කිසිවක් ඔබ අතරෙහි නොදැන සිටින්නට නියම කර ගතිමි."
(කො. ii. 1, 2)

---

# ගරු හෙලේනා සොහොයුරිය භාග්‍යවරයට පත් කිරීම සඳහා යාච්ඤාව

අති ශුද්ධවූ පියාණනී, සර්ව සාධාරණ වූ දෙවියනී/ ඔබ වහන්සේගේ ප්‍රේමණීය පුත්‍රයාණන්ගේ දුඃඛ ප්‍රාප්තියට/ විශේෂ භක්තියක් දැක් වූ/ හෙලේනා සොහොයුරිය වෙනුවෙන්/ ඔබ වහන්සේට තුති පුදමු. එතුමිය මත ඔබගේ ස්නේහවන්ත පුත්‍රයාණන්ගේ / ශ්‍රී වණ කැළැල් පවා ඇති වන්නට සලස්වමින් අපව ද දිරිමත් කරවමින් / ඔබ වහන්සේ වෙතටම පැමිණීමට අපට භාග්‍යය සලසා දුන් සේක් වේද? / දුබල අපහට යහපත් ආදර්ශයක් දෙමින් එතුමියගේ ජීවිතය තුළින් අපහට දුන් සෑම වරකටම / අපි ඔබවහන්සේට තුති පුදමු.

එසේම ගරු හෙලේනා සොහොයුරිය භාග්‍යවරයට එසවීමේ ප්‍රීතිය භුක්ති විඳීමට ද අපට වරම් දුන මැනව.

මේ කී දේ අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින්ම අපට ලැබේවා. ආමේන්. *(පර, නමෝ. 1, ත්‍රිත්ව. 1 කියන්න)*

**- ගෝනාවිල සිස්ටර් හෙලේනා පදනම -**




ගෝනාවිල ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව් මැඳුර තුළ
ගරු හෙලේනා තුම්ය විසින් ආරම්භ කරන ලද
ශ්‍රී වත මඬල භක්තිය



ගෝනාවිල දෙව් මැඳුර ඉදිරිපිට සුසාන භූමියේ
ගරු හෙලේනා තුමිය මිහිදන් කර ඇති ස්ථානය



**1931 පෙබරවාරි 08 වන දින දී ස්වර්ගස්ථ වූ
ගරු හෙලේනා තුමියගේ ශ්‍රී දේහය, එතුමිය ජීවත්ව සිටි නිවස
ඉදිරිපිට වඩවා තබා බුහුමන් කළ අයුරු**




ගෝනාවිල ගරු හෙලේනා තුමිය ජීවත්ව සිටිය දී
භාවිත කළ හිස පළඳනාව




එතුමිය ජීවත්ව සිටිය දී භාවිත කළ
ශුද්ධවූ භාණ්ඩ




එතුමිය ජීවත්ව සිටිය දී පරිහරණය කළ
ශුද්ධවූ කුරුසිය




එතුමියගේ ශ්‍රී ශරීරය තැන්පත් කර ඇති ස්ථානය
වසා ඇති සමරු ඵලකය



**වණකැළැල්ධාරී ගෝනාවිල ගරු හෙලේනා තුමිය ජීවත්ව සිටිය දී භාවිත කළ භාණ්ඩ තැන්පත් කර ඇති කෞතුකාගාරය**

## කාරුණික ආයාචනයයි......!

ශ්‍රී වණ කැළැල් තම ශරීරයේ දරා සිටීමට භාග්‍යය ලත් ගෝනාවිල ගරු හෙලේනා තුමිය සම්බන්ධව ඔබ දන්නා, ඔබගේ දෙමාපිය - ඥාතීන් ඔබට පවසා ඇති සිද්ධීන් හෝ එතුමිය පිළිබඳ පෞරාණික යම් ලියවිල්ලක් හෝ භාණ්ඩයක් ඔබ හෝ ඔබ දන්නා කෙනෙකු භාරයේ ඇතොත් ඒ පිළිබඳ විස්තරයක් පහත සඳහන් ලිපිනයට සපයන මෙන් දන්වමු. එය ඔබගේ වගකීමකි. යුතුකමකි.

ස්තූතියි.

**මෙයට,**
**මීසම් සේවක,**
**ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා**

**ශාන්ත ජෝශප් දෙව්මැඳුර, ගෝනාවිල, දංකොටුව.**